## ‘පට්ඨාන ධර්ම දේශනා මාලාව’

## 7 වෙනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන්වහන්සේට අතීතය අනාගතය වර්තමානය කියන කාලත්‍රයට සම්බන්ධ සියලුම ආධ්‍යාත්මික ධර්‍මයන් බාහිර ධර්‍මයන් සූක්ෂම ධර්‍මයන් ඕලාරික ධර්‍මයන් සර්වප්‍රකාරයෙන්ම සවයම්භූ ඥානයෙන් සර්වඥතාඥානයෙන් අවබෝධ කොට ගත්තා වූ මහා කරුණාවෙන් පිරි සන්තානයක් ඇත්තාවූ තමන් වහන්සේ අවබෝධ කොට ගත්තාවූ ධර්‍මය නොපැකිලව නිර්ලෝභීව ලෝක සත්වයා කෙරෙහි කරුණාවෙන් යුක්තව නිර්මලව පැහැදිලිව දේශනාකොට වදාළා වූ දේශනා ඥානයෙන් සමන්නාගත වූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනව මගේ නමස්කාරය වේවා!

ඒ සම්මාසම්බුදු රජාණන්වහන්සේගේ සන්තානයෙන් ප්‍රඥාවෙන් දැන වදාළා වූ දේශනා කොට වදාළා වූ අනන්ත අපරිමාණ ගුණ ඇති ශ්‍රී සද්ධර්ම රත්නයට මම නමස්කාර කරනව මාගේ නමස්කාරය වේවා!

ඒ දේශිත ධර්‍මයට අනුකූලව ප්‍රතිපදාවේ ගමන් කොට ප්‍රතිපදාවේ පිහිටා ශ්‍රී සද්ධර්මය අවබෝධ කොට ගත්තාවූ ආර්ය තත්වයට පත් වුනාවූ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක මහා සංඝ රත්නයට සිරසින් වැඳ නමස්කාර කරනව මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධර්‍ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් තුනුරුවන් කෙරෙහි ප්‍රසාද චේතනාවෙන් යුක්තව වන්දනා කිරීම් මාත්‍රයෙන් උපදවාගත්තාවූ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අද මේ පින්වත් සැම දෙනාටම මේ ධර්‍ම සාකච්ඡාව තුලින් මේ කියල දෙන්නාවූ දේශනාව තුලින් ධර්‍ම කරුණු ටිකෙන් මේ දේශනා කරන සැම ධර්‍ම කරුණක්ම පැහැදිලිව පිරිසිඳුව හොඳින් තේරුම් ගැනීමට ශක්තිය ලැබේවා! සැම දෙනාටම හොඳින් වටහාගන්න ශක්තිය ලැබේවා! සියලු දෙනාටම ඒ සඳහා

අවශ්‍ය කරන්නාවූ මානසික ධර්ම පරිසරය ප්‍රඥාව සමාධි ගුණය වැඩේවා! මනසිකාරය පවත්වමින් එක එක ධර්ම කාරණයක් පාසා සිහිය නුවණ යොදා ඒ ධර්ම කරුණු සියුම්ව අවබෝධ කොටගෙන එයම ප්‍රතිපදාවක් කරගෙන බුදුරජාණන්වහන්සේ අවබෝධ කොට ගත්තාවූ සදාකාලික සැප ඇති නිර්වාණ ධාතුවෙන් සැනසෙන්ට නිවන් අවබෝධ කර ගන්නත් හැකිවේවා! ඒ සඳහා මෙය ප්‍රතිපදාවක් වේවා! කියල අපි මෛත්‍රියෙන් කරුණාවෙන් ප්‍රාර්ථනා කරනවා. ඉතින් ඒ ප්‍රාර්ථනාවත් සමගම මේ පින්වතුන්ට අද හිතාගෙන ඉන්නවා කොටසක් කියල දෙන්ට කියල. ඒ කොටස මම මෛත්‍රියෙන් කරුණාවෙන් කියල දෙනවා.

මේ දක්වාම අපි කථා කරගෙන ආව 'හේතු ප්‍රත්‍යයයේ' තිබෙන්නාවූ ස්වභාවය. හේතු ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව කියල දුන්න, හේතු ධර්ම කියලා දුන්න. ඊළඟට හේතු ධර්මයේ තිබෙන්නාවූ ප්‍රත්‍යය ගුණය ප්‍රත්‍යය ශක්තිය අපි පින්වතුන්ට මතක් කළා. ඊළඟට හේතු ධර්ම වෙන වෙනම හිත්වල වැඩ කරන විදිය - අපි අකුසල් පිළිබඳව කථා කරා - කුසල ධර්ම පිළිබඳව කථා කරා. කුසල සිත් පිළිබඳව කාමාවචර - ඒවගේම අරූපාවචර සිත්වල ඒ හේතු යෙදෙන තාලේ අපි කථා කරා - සිත් වල එක එක හැටියට අරගෙන.

අද දවසේ මම කැමතියි මේ පින්වතුන්ට කියල දෙන්ට 'ආරම්මණ ප්‍රත්‍යය' පිළිබඳව. ඒ තමයි දෙවෙනි ප්‍රත්‍යය ධර්මය. ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව කථා කරන්නේ. මේ ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව මීට ඉහතදී මගේ මතකයේ හැටියට එක වතාවක් කථා කරා කියල. නමුත් මේ series එක යන නිසා අදත් මම මේ වෙලාවට ගැලපෙන ධර්ම කොටසක් ඒ ආරම්මණ ප්‍රත්‍යය හරහා කියල දෙනවා. මේක ඉතාමත්ම වැදගත් පාඩමක්. වැදගත් දහම් කොටසක්. මහ අමුතුම කියමනක් අපිට දැනගන්න පුළුවන් මේ පාඩම එහෙම නැත්තම් මේ ධර්ම කරුණු ටික ඇරගෙන යනකොට.

ආරම්මණය කියල කියන්නේ හිතක් පහළ වීමට චෛතසික ධර්ම පහළ වීමට අරමුණු හැටියට උදව් වෙන්නාවූද ඒවාගේම හිතට සහ චෛතසික ධර්ම වලට අල්ලගන්න පුළුවන් වන්නාවූද හසුකරගන්න පුළුවන් වන්නාවූද අරමුණු කර ගන්න පුළුවන් වන්නාවූද ධර්මයක්. ඒක තමයි ආරම්මණය කියල කියන්නේ. අරමුණ කියල කියන්නේ හිතින් අල්ලාගන්ට හසු කරගන්ට ග්‍රහණය කරගන්ට පුළුවන් වන දෙයක්. ඒක තමයි ආරම්මණය. මේ ආරම්මණ ආකාර වශයෙන් විවිධයි. මීට ඉස්සර අපි කථාකරා හේතු ප්‍රත්‍යය පිළිබඳව. මේ වෙලාවේදී ඒ කථාව සම්පූර්ණයෙන්ම අපි අයින් කරගන්ට ඕනෑ. ඒකෙ තිබෙන ඒකෙ කියවපු

කොටස මේකට සම්බන්ධ වෙලා යම්කිසි පටලැවිල්ලක් වෙන්ට පුළුවන්. ඒකනිසා ඒක නොවෙන්ට නම් අපි මේ ආරම්මණය කියන එක ඉස්සරවෙලා හොඳට තේරුම් ගන්ට ඕනෑ. වටහාගන්න ඕනෑ.

හිතකට අහුවෙන්නා වූ චෛතසික ධර්මයන්ට අහු වෙන්නාවූ දේ තමයි ආරම්මණය. එතකොට අරමුණක් හැටියට හිත්වලට චෛතසික ධර්ම වලට පහළ වෙලා තමන්ගේ පැත්ත බලන්ට තමන් නිසා තමන්ගේ උදව්වකුත් ඇතුව ඒ චෛතසික ධර්මයන්ට පහළ වෙන්ට උපකාර වන්නාවූ ධර්මයන්ට කියනවා අරමුණු කියල. ඒ ආරම්මණ වලත් තිබෙනවා අර ප්‍රත්‍යය ගතිය. ධර්මස්වභාව ගොඩවල් 5 ක් කියවෙනවා. ඒ තමයි 1). සිත කියන්නාවූ ධර්මස්වභාවය. 2). සිතේ පහළ වෙන්නාවූ චෛතසික නම් වූ ධර්මස්වභාවය 3). රූප නම් වූ ධර්මස්වභාවය 4). නිර්වාණ ධාතුව නම් වූ ධර්මය. 5). ප්‍රඥප්ති කියන ධර්ම = පැනවීම්. මෙන්න මේ ධර්ම ගොඩවල් 5 ආරම්මණ ප්‍රත්‍යය හැටියට කථා කරනවා. මේකෙ එකක්වත් නෑ අරමුණක් නොවෙන්නාවූ දෙයක්. දැන් සිත් තමයි අරමුණ දැනගන්නේ. අරමුණක් ගන්නේ - හිත. යම් කිසි දෙයක් දැනෙන්නේ හිතටයි. යම් කිසි දෙයක් දකින්නේ හිතෙන්. යම් කිසි දෙයක් අහන්නෙ හිතෙන්. ඒ අහන්නාවූ දැනගන්නාවූ හිතට ගොදුරුවන දේවල් අරමුණු.

මේක කොටස් දෙකකට බෙදෙනවා. මම කිව්වා ගොඩවල් 5ක්. ඒ කියන්නේ සිත් ගොඩ - චෛතසික ධර්ම ගොඩ - රූප ගොඩ - නිර්වාණය කියන ධර්මස්වභාවය - ප්‍රඥප්ති . මේකෙන් සිතයි චෛතසික ධර්මයි අපි වෙනම ගොඩක් හැටියට හඳා ගන්නවා. රූපයි - නිර්වාණ ධාතුවයි - ප්‍රඥප්තියයි කියන එක තවත් ගොඩවල් තුනක් හැටියට සලකා ගන්නවා. මේක කොටස් දෙකක් හැටියට මේ විදියට සකස් කර ගන්නවා. මේක එහෙම කරන්න හේතුව මේකේ තිබෙන්නාවූ විවිධ ධර්මස්වභාවයන් තේරුම්ගන්ට. එතකොට අරමුණයි කියල කියන්නේ සිතෙන් අල්ල ගන්ට දේට. සිතෙන් හසු කර ගන්න දැන ගන්න දේට. හිතට තිබෙනවා ගුණයක් - ගතියක් - ශක්ති විශේෂයක්. ඒක පැත්තට හැරිලා ඉන්න ඕනෑම දෙයක් ඕනෑම ධර්මයක් දැන ගන්ට පුළුවන් ගතිය. එහෙම ගතියක් හිතට තියෙනවා. අරමුණ කියල කියන්නේ අර දැකීමෙ ගතිය තිබෙන - බැලීමෙ ගතිය තිබෙන - දැන ගැනීමේ ගතිය තිබෙන්නාවූ හිත පැත්තට තමන් පෙනී හිටින - තමන් එයාට නිකං අහුවෙන්ට - එයාට දැනෙන්ට ඉදිරිපත් වෙන්නාවූ ගති ස්වභාවයක් ඔය ආරම්මණයේ තිබෙනවා.

දැන් අපි හිතුවාම කැමරාවක් පිළිබඳව, ඒ කැමරාවේ තිබෙනවා පින්තූරයක් ගැනීමේ ලක්ෂණය - ගුණය. ඒ පින්තූරයක් එහෙම නැත්නම් වර්ණයක් -

ඡායාවක් ග්‍රහණය කර ගැනීමේ ගතිය - හැකියාව කැමරාවට තියෙනව. ඒ කැමරාවට ශක්තිය තියෙනව වගේම අර එළියේ තියෙන්නාවූ පින්තූරයට එහෙම නැත්නම් මොකක් හරි ගහක් හරි ගලක් හරි පුද්ගලයෙක් හරි ඒකට අහුවෙන දෙයක තිබෙනවා අර කැමරාවට ග්‍රහණය වෙන්ට පුළුවන් එක්තරා විදියක ගතියක්. ඒ ගතිය ඒකේ තියෙන නිසා තමයි කැමරාවේ වදින්නේ. එහෙම නැත්නම් ඒක වදින්නේ නෑ. දැන් බලන්න අහස photo ගහන්න බෑනේ. අහස photo ගහන්න බෑ. අහස අහුවෙන්නේ නෑ. හැබැයි ඔය තියෙන වර්ණ රූප - වස්තු ඒවා අහුවෙනවා. හේතුව ඒ වර්ණ වල - ගස් වල - ගල්වල - පුද්ගලයන්ගේ රටාවල තිබෙනවා කැමරාවට ග්‍රහණය කර ගන්ට - තමන්ව අල්ලගන්ට ඉදිරිපත්වෙලා නිකං අරමුණක් හැටියට - පින්තූරයක් හැටියට ඉදිරිපත්වන ගතිය. ඒ ගති ස්වභාවය ඒකෙ තියෙන හින්ද තමයි කැමරාවට ගහ ගන්න පුළුවන් කම තියෙන්නේ. ආන්න ඒ වාගේ ස්වභාවයක් තිබෙනවා සෑම අරමුණකම. දැන් වර්ණ රූපයක් අපේ ඇහැ ඉදිරියේ තියෙන කොට වර්ණ රූපය දකින්නේ ඇත්ත වශයෙන්ම ඇහෙන් නෙමෙයි. වර්ණ රූපය දැන ගන්නේ ඇහෙන් නෙමෙයි. ඒ දැකීමේ ක්‍රියාවලිය නියම විදියට සිද්ධ වෙන්නේ හිතෙන්. හිතට තමයි වර්ණ රූපය අහුවෙන්නේ වර්ණ රූපය ගන්නේ. හැබැයි ඇහැ හිතට උදව් වෙන මධ්‍යස්ථානයක් පමණයි. හිතට ඒ වර්ණය ගන්න උපකාරවන්නාවූ මාධ්‍යයක් විතරයි ඇහැ. දැන් හිතට සහ චෛතසික ධර්මයන්ට මේ වර්ණ රූපය ‘අනේ මාව ගන්න හැකිවේවා’ කියන්න වගේ ‘මාව හිතට දැනේවා’ කියන්න වගේ යම්කිසි ගුණ විශ්ෂයක් ඒ අරමුණේ තිබෙනවා ඒ සිතට තමන්ව දැන ගන්න. ඒ ගුණ විශේෂයට ඒ ගති විශේෂයට කියනවා ‘ආරම්මණ ප්‍රත්‍යය’ කියල. හැම අරමුණකම ඔය ප්‍රත්‍යය ශක්තිය - ප්‍රත්‍යය ගුණය තියෙනව. ඒ ගුණය තියෙන නිසා තමයි සිත් වලට ඒවා දැනගන්න පුළුවන් කම තියෙන්නේ.

ශබ්දයක් ගත්තයින් පස්සේ හැම ශබ්දයකම තියෙනවා හිතට අහුවෙන්න පුළුවන් ගුණ විශේෂයක්. ඒක නිසා ඒ ශබ්දය සිතට අහුවෙන්න උදව් වෙනවා උපකාර වෙනවා. ඒකට කියනවා ශබ්දයේ තිබෙන ආරම්මණ ප්‍රත්‍යය කියලා. ආරම්මණයක් හැටියට උපකාර වෙන ගතිය. කාටද උපකාර වෙන්නේ කොහෙටද උපකාර වෙන්නේ අර චිත්ත චෛතසික ධර්මයන්ට. රූපය කොහෙටද උපකාර වෙන්නේ චිත්ත චෛතසික ධර්මයන්ට. ඇයි? ඒක දැනගන්ට.

ඊළඟට ආඝ්‍රාණයෙන් ගන්න ගඳ සුවඳ - ඊළඟට දිවෙන් ගන්න රසය - ආහාර වල තියෙන රසය ආදී ඒ ධර්මත් කයට දැනෙන්නාවූ ස්පර්ශ ආදී ධර්මවලත් තිබෙනවා හිතක් උපදින්න හිතට අහුවෙන්න අරමුණුවීමේ ගති ස්වභාවයක්. ඒකට කියනවා ආරම්මණ ප්‍රත්‍යය කියල.

දැන් මම මීට ඉස්සෙල්ල කිව්වා හිතයි චෛතසික ධර්මයි එක පැත්තකට දානවා රූපයි නිර්වාණ යයි ප්‍රඥප්ති යයි කියන කරුණු 3 තව පැත්තකට දානවයි කියල. එහෙම කරන්ට හේතුව මේවගේ තියෙන විවිධත්වය තේරුම් ගන්ටයි. දැන් අපි එක හිතකින් මොකක් හරි දෙයක් දැන ගන්නවා. අපි හිතමු ශබ්දයක් දැන ගත්ත. plane එකක් යන සද්දයක් දැන ගත්ත. ඒ ශබ්දය තමයි අරමුණ. ඒ ශබ්දයේ තිබෙනවා ගුණ විශේෂයක් හිතකට අහුවෙන්න - හිතක් උපදවන්ට - චෛතසික උපදින්ට උපකාරවීම් ගුණයක්. දැන් ඔන්න ඒ හඬ ඇහුව. දැන් අහල ඉවරයි. ඊළඟට අපි ඒ හඬ ඇහුවේ හඬ දැනගත්තේ සිත සහ තව චෛතසික ධර්ම සමූහයකින්. දැන් ඒක අතීතයට ගියා. අතීතයට ගියා - දැන් අපි හඬ අහපු හිත පිළිබඳව පස්සේ මෙනෙහි කරනවා - හිතනවා. ඒ හිතන වෙලාවේ අර ටිකකට කලින් අර හඬ අහපු හිත පස්සේ හිතකින් අරමුණු කරලා අපි දැන ගන්නවා. එතකොට මේ හිතේ තිබෙනවා අර අරමුණු ගන්න ගතිය විතරක් නෙමෙයි - දැන් අපි ඉස්සෙල්ල කිව්වනේ අරමුණක් දැන ගැනීමේ ගතිය හිතට තියෙනවයි කියල, දැන් මෙතනදී වෙන්නේ අරමුණු දැන ගැනීමේ ගතියත් හිතට තිබෙනවා, ඒවගේම තවත් හිතකට තමන්ව අරමුණක් හැටියට ඉදිරිපත් වෙන්න පුළුවන් ගතියත් හිතේ තියෙනවා. ඒකනිසා තමයි අපිට තවත් හිතක් මේ හිතකින් අරමුණු කරන්න පුළුවන් වෙන්නේ. හිතට තියෙනව අරමුණු ගැනීමේ හැකියාව - හිතට තිබෙනවා අරමුණක් හැටියට තමන්ව තවත් හිතකට පෙනෙන්ට අරමුණක් හැටියට ඉදිරිපත් වීමේ හැකියා ගුණය. චෛතසික ධර්ම වලටත් තියෙනව එහෙම. චෛතසික ධර්මවලින් ‘අරමුණුවල’ තිබෙන්නාවූ ගුණ ප්‍රභේදයන් දැනගන්ට උදව් කරනවා - ඒවගේම හිතට අරමුණක් ගන්ට උදව් උපකාර කරනවා මේ චෛතසික ධර්මයෝ. අරමුණු වෙතට යන ගතිය තියෙනවා. ඒවගේම තමයි ඒ චෛතසික ධර්මයන් හිතත් එක්ක ගිහිල්ලා අරමුණු අල්ලන්න වගේ තවත් හිතකට තමන්ව අරමුණක් හැටියට ගොදුරු වෙන්න පුළුවන් ගතියත් - අරමුණු වීම් ගතියත් ඒ චෛතසික ධර්ම වල තිබෙනවා. ඒ නිසා මේ සිත සහ චෛතසික ධර්මවල අරමුණු අල්ලන ගතියයි - තමන්ව අරමුණු වීම් ගතියයි කියන ධර්මතා දෙකම තියෙනවා.

හැබැයි රූප වලට එහෙම හැකියාවක් නෑ. රූප වලට තමන්ව අරමුණක් හැටියට පෙනීහිටින්ට විතරයි පුළුවන්කම තියෙන්නේ. අරමුණු වෙන්ට පුළුවන් හැබැයි අරමුණු ගන්ට බෑ රූපයට.

නිර්වාණ ධාතුවට තිබෙනවා මෙහෙම එකක්. නිර්වාණ ධාතුවටත් හිතකට අරමුණු වෙන්න පුළුවන් හැබැයි නිර්වාණ ධාතුවට තවත් දෙයක් අරමුණු කරන්ට

බෑ. ඒ නිසා මාර්ග අවස්ථාවලදී ඵල අවස්ථාවලදී ලෝකෝත්තර සිත්වලට නිර්වාණ ධාතුවත් ලෝකෝත්තර ආරම්මණයක් හැටියට ඒ හිත්වලට පේන්ට අරමුණු වීම් වශයෙන් උදව් වෙනවා උපකාර වෙනවා එහෙම නැත්නම් ප්‍රත්‍යය වෙනවා ඒ හිත්වලට හැබැයි වෙන එකක් දැකීමේ හැකියාව නෑ.

ප්‍රඥප්තිය කියල කියන්නේ වචනය. ප්‍රඥප්තිය කියල කියන්නේ එක එක දේවල් වලට තියල තියෙන සටහන් - සංඥා - ප්‍රඥප්ති - වචන මාත්‍රා. ඒ වචන මාත්‍රා වලට අනිත් දේවල් ගැන හිතාගන්ට - දැන ගන්ට - හඳුනා ගන්ට බෑ. හැබැයි ඒ ප්‍රඥප්ති වලට තිබෙනවා හිත්වලට තමන්ව අරමුණක් හැටියට පෙළ ගැස්සිලා ඉදිරිපත් වෙලා මතුවෙන්ට පුළුවන් ගතිය. ආරම්මණ ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වීමේ ගතිය තිබෙනවා. මේක හරිම හරි සියුම් ගතියක්. පුදුම සියුම් ධර්ම ස්වභාවයක්. මේක තිබෙනවද නැත්ද කියල හඳුනා ගන්ට බැරි තරමටම ඒක අතිශය සියුම්. ඒ ආරම්මණ ප්‍රත්‍යය කියන එක අතිශය සියුම්.

තව එකක් තියෙනවා - මම ගිය සතියේ හරි ඊට ඉස්සෙල්ල සතියක හරි උදාහරණයක් කියල දුන්න. වෙන තැනකට ඒක පාවිච්චි කරේ - යෙදුවේ. ඒක මෙතෙන්ටත් ඇත්ත වශයෙන්ම විශේෂයෙන්ම ගන්ට සිද්ධ වෙනව. ඒ තමයි අල කොළයයි රෙදි කඩයි. අල කොළයක් රෙදි කැල්ලක් ගත්තම ලක්ෂණ දෙකක් තිබෙනවා. ඒ තමයි අල කොළයට වතුර දැම්මම වතුර රඳවා ගන්නේ නෑ. ඒක අල කොළේ ගැවෙන්නේ නැතිවෙන්න අයින් කරන්න පුළුවන් ගතියක් - භාරනොගෙන - වතුර තමන්ගේ අල කොළේ ගැවෙන්ට නැතිවෙන්ට තියා ගන්ට පුළුවන් ගතියක් අලකොළේ තියෙනවා. භාරගන්නේ නෑ. තමන්ගේ ඒ අල කොළේ ඇඟේ ගාව ගන්නේ නෑ. ඒක නිසා වතුර ඉක්මනට පෙරිල බෝල වගේ ගිලිහිලා යනවා. රෙදි කැල්ලකට වතුර දැම්මහම එහෙම නෙමෙයි. රෙදි කැල්ලේ තිබෙනවා වතුර උරාගන්න - භාර ගන්න - පොඟවා ගන්න ගතිය. එහෙම එකක් තියෙනවා. එතකොට එකක් මේ වතුර ප්‍රතික්ෂේප කරනවා අනෙත් එකේ වතුර ඇද ගන්නවා.

අන්න ඒවගේ ආරම්මණයේ තිබෙනවා ගතියක් අර හිතට ගිහිල්ලා හිතට දැනගන්න - හිතට කාවැදී ගෙන යන - හිතට අරමුණු වීගෙන යන ගුණ ස්වභාවයක් ඔය අරමුණු වල තිබෙනවා. ඒක හරිම සැඟවිච්ච ප්‍රත්‍යය ධර්මයක්. යම් කිසිදේකට - යම් කිසි හිතකට - චෛතසික ධර්ම සමූහයකට ඒ ‘අරමුණ’ අරමුණු වෙන්නේ, ඒකට චිත්ත චෛතසික ධර්මයන් උපදින්ට තමන් උපකාරයක් වේවා කියල උපකාර වෙන්න පුළුවන් ‘ආරම්මණ ගතියක්’ – ‘අරමුණු ප්‍රත්‍යය ගතියක්’ තියෙන හින්ද. අනිත් එක තමයි ආරම්මණ ප්‍රත්‍යය යෙහි තියෙනවා

ප්‍රත්‍යය ශක්ති ගතියක්. ප්‍රත්‍යය ගුණ ගතියක්. ඒක තියෙන නිසා තමයි චිත්ත චෛතසික ඒ හරහා උපදින්නේ.

තවත් එකක් - අතීතයේ වැඩ හිටපු ගෞරවනීය ස්වාමීන්වහන්සේලා සඳහන් කරලා තිබෙනවා අපිට ධර්‍මය දැන් ගන්ට මතු කරලා තිබෙනවා - ඒ තමයි අරමුණුවල චිත්ත චෛතසික ධර්‍මයන්ට අරමුණු වීම් වශයෙන් ඉදිරිපත් වන ගුණ වල විවිධත්වයක් තිබෙනවා.

දැන් බලන්න මේ sponge කෑල්ලකට වතුර ටිකක් දැම්මම ඒ වතුර ටික ඇතුලට කාවද්ද ගන්නවා. රෙදි කෑල්ලකට වතුර ටිකක් දැම්මම ඒ වතුර ටික රෙදි කෑල්ලට උරාගන්නවා කාවද්දාගන්නවා. හැබැයි අපි ඉටි කොලේකට වතුර දැම්මම ඒ ඉටි කොලෙත් වතුර ගෑවිලා යනවා හැබැයි තදට කාවද්ද ගන්නේ නෑ. එතකොට ඉටි කොලේ වතුර ගෑවෙන ගතිය තියෙනවා හැබැයි ඒ උරාගන්නා ගතිය නෑ. ඒවගේම රෙදි කෑල්ලේත් තිබෙනවා sponge කෑල්ලේත් තිබෙනවා වතුර ගෑවෙනවා විතරක් නෙමෙයි තද බල විදියට උරාගන්නා ගතිය. ඔයවගේ සමහර අරමුණු වල තිබෙනවා හිත්වලට - චෛතසික ධර්‍ම වලට නිකං තද බල විදියටම අරමුණු වෙන්ට පුළුවන් ගතිය. සමහර ඒවගේ තියෙනවා, ඒවා අරමුණු වෙනවා හැබැයි ගොඩ හැටියට තමන් වෙතට චිත්ත  චෛතසික ධර්‍මයෝ නම්මාගෙන පහළ කරවාගන්ට ඒ තරම් බලයක් නෑ. හැබැයි 'ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය' හැම එකටම තියෙනවා. ඒක හැබැයි සමහර ඒවගේ අඩුයි සමහර ඒවගේ වැඩියි.

ඕක කොහොමද අපි තේරුම් ගන්නේ. මේක මහා බරපතල මාතෘකාවක් වගේම ගාම්භීර සියුම් මාතෘකාවක්. අපි හිතමු ගස් ගොඩක් තිබෙනවා. Park එකක ගස් ගොඩක් තියෙනවා. ඔය ගස් වල කොළ විතරක් තිබෙන ඒවත් තිබෙනවා. මල් හැදිලා තිබෙන ඒවත් තියෙනවා. ලස්සනට Camellia ගහක මල් පිපිලා තියෙනව ඒවා රෝසමල් වගේනේ. තව තියෙනව රෝස පඳුරක් හොඳ ලස්සනට මල් පිපිලා තියෙනවා. යම් කිසි කෙනෙක් ඔය park එකට ගියැන් පස්සේ මල් පිපිච්ච රෝස ගස් තියෙනව ඒවගේම මල් පිපිච්ච Camellia ගස් තියෙනවා. තවත් මල් නැති ගස් තියෙනවා. දැන් මේක දිහා බැලුවයින් පස්සේ මේ මල් තිබෙන ගස් රෝස ගහ - Camellia ගහ පැත්තට ගොඩක් හැරිලා බලන් ඉන්නවා. ඒ මල් ගැන කතා කරනවා. ඒ මල් ගැන හිතනවා. මලුත් එක්ක photo ගහනවා. මල් ගහ ගාවට යනවා. හැබැයි එවැනි කථා කිරීමක් එවැනි photo ගැසීමක් එවැනි පිළිගැනීමක් අනිත් ගස් වලට නෑ. එතකොට මේ මල් ගහට තියෙනවා අර එතෙන්ට ආපු - මල් ගහ දිහා බලපු අයගේ හිත්වල තමන් ගැන (ඒ කියන්නේ

මල් ගහ ගැන) ටිකක් වැඩිපුර බලව ගන්ට - වැඩි පුර හිතවා ගන්ට - වැඩිපුර කථා කරවා ගන්ට - චිත්ත චෛතසික ධර්මයන් පහළ කිරීම් වශයෙන් අරමුණු වීම් හැකියාවක් ඒකෙ වැඩිපුර තියෙනවා. ඒක නිසා අනිත් ගස්වලට වඩා රෝස ගහේ රෝස මල් වල Camellia ගහේ Camellia මල්වල ටිකක් වැඩිපුර ආරම්මණ ප්‍රත්‍යය ගුණය - ශක්තිය තියෙනවා. ඒ වගේම සමහර ඒවා තියෙනවා අඩුයි.

තවත් එකක් අපි හිතමු නරක පැත්තට. දැන් සමහර වෙලාවට නරක පල් වෙච්ච වතුර වලවල් තිබෙනවා. පල් වෙච්ච බලු කුණක් - ගැරඬි කුණක් වගේ දෙයක් එහෙම නැත්නම් කුණු ගොඩවල් තිබෙනවා. මල් ගොඩවල් පල් වෙලා තිබෙනවා කුණු වෙලා තිබෙනවා. ඒ වගේම ගස් වලින් දුර්ගන්ධය හමනවා. අපි හිතමු ඕවත් ඉතින් අරමුණුවීම් වශයෙන් නරක අරමුණක් වුනත් චිත්ත චෛතසික ධර්මයන් මනුස්සයන් තුල ඒ සම්බන්ධයෙන් පහළ කරන්ට පුළුවන් හැකියා ගුණයක් ප්‍රත්‍යය ගුණයක් ඒවගේ තියෙනවා කියල. අපි ඔය අතරට දාමු මිනියක් කුණු වෙලා තියෙනවා. එතකොට ඒ මිනී කුණ කියන ඒකෙ ගඳත් ඇවිල්ල අරමුණක්නේ හිතට. හැබැයි අනිත් ඔය කුණු ගොඩවල් - ජරා ගොඩවල් වල තිබෙන්නාවූ ගඳට වඩා ටිකක් වැඩිපුර තමන් ගැන හිතවන - කථා කරවන - චිත්ත චෛතසික පහළ කරවන ගුණ ගතියක් හැකියා ගතියක් අර මළකුණේ තිබෙනවා. සංඥා වශයෙන් හෝ විපල්ලාස වශයෙන් හෝ මොහොකින් හරි ඒක තියෙනවා. ඒක තියෙන හින්ද තමයි එහෙම කථා කරන්නේ. ඒක නිසා සමහර අරමුණු වල ආරම්මණ ප්‍රත්‍යය ගුණය වැඩි පුර තියෙනවා. සමහර ඒවගේ ආරම්මණ ප්‍රත්‍යය ගුණය අඩුවෙන් තියෙනවා. වැඩියෙන් තියෙන එකේ වැඩියෙන් චිත්ත චෛතසික පහළ කරනවා.

දැන් අපි මෙහෙමත් හිතමු. අපි වතුර බොනවා, තේ බොනවා. එතකොට වතුර බොන කොට ඒත් වතුරක්, තේ බොන්නෙත් සීනි දාල - කිරි දාල - කහට දාල බොනවා. එතකොට මේ වතුර බිව්වට වතුර වල හිතෙන් දැන ගන්න එහෙම නැත්නම් රහ ගතිය අරමුණක් හැටියට රස වශයෙන් - අරමුණු වශයෙන් - අරමුණු වීම් වශයෙන් තිබෙන ගුණය වතුර වල අඩුයි. හැබැයි තේවල - කෝපි වල - සීනි වල තිබෙනවා රස ගතිය අරමුණු වීම් වශයෙන් ඒකෙ ගුණය - ආරම්මණ ප්‍රත්‍යය ගුණය වැඩියි.

ඒවාගේ පාට වශයෙනුත් තියෙනවා. සමහර පාට ඒ තරම් හිතවත් නෑ. සමහර පාට අද්දල යනවා. පුද්ගලයාගෙන් පුද්ගලයාටත් ඒක වෙනස් වෙන්න පුළුවන්. මේ වගේ ආරම්මණ ප්‍රත්‍යය, ආරම්මණ ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වන දේවල්, ඒ

අරමුණු වල හිත්වලට අරමුණු වීම වශයෙන් ප්‍රත්‍යය වන ගතිය සමහර ඒවගේ වැඩියි. සමහර ඒවගේ අඩුයි.

අපි මේ කරුණු දෙකක් බෙදාගන්ට ඕන කියල කිව්වා. චිත්ත සහ චෛතසික ධර්ම අරමුණු කරනවා වගේම තමනුත් අරමුණු වෙනවා. ඒ අතරත් තියෙනව සමහර සිත් - ඒවා ටිකක් සැරට අපිට අරමුණු වෙනවා. අපි හිතමු ලෝභ සිතක් නම් තරහ සිතක් නම් ඊර්ෂ්‍යා සිතක් නම් ඒවගේ දේවල් ටිකක් ලොකුවට ලොකුවට අපිට අරමුණු වෙනවා. ඒ කියන්නේ ඒකෙ තියෙන කර්කශ ගතිය - ගොරෝසු ගතිය එහෙම නැත්නම් ඒකෙ ආරම්මණ ප්‍රත්‍යය ගුණය ටිකක් වැඩියි.

තවත් තියෙනවා ඔය විතර්කය කියන චෛතසිකය, ඊළඟට මනසිකාර කියන ඒවා - මේවා හරිම සියුම් - මේවා අල්ලන්ට හරි අමාරුයි. එකපාරම අහුවෙලා යන්නේ නෑ. ඊළඟට උපේක්ෂා ගතිය. ඒකත් ඒ වගේ.

දැන් ප්‍රසාදය කියන ගතිය සැපය කියන ගතිය ප්‍රීතිය කියන එක මේවා ටිකක් ඕලාරිකයි. ඒක නිසා ඒවගේ අරම්මණ ගතිය ටිකක් බරපතල වැඩියි. එය පැහැදිලිව තියෙනවා. ආන්න ඒවගේ තිබෙනවා ඔක්කෝම ටික ගත්තම සාමූහික වශයෙන් අරමුණු වීම් ගුණය තිබෙනවා හැබැයි අරමුණු වීම් වශයෙන් ඒවගේ තිබෙනවා ප්‍රභේද අඩු වීම වශයෙන් සහ වැඩි වීම් වශයෙන්.

ආරම්මණයක් හැටියට හිත්වලට අරමුණු වන ධර්මතා එතකොට කිව්වා කීයක්ද? 5 ක්. එකක් තමයි සිත - අනිත් එක තමයි චෛතසික ධර්ම - අනිත් එක තමයි රූප ධර්ම - අනිත් එක තමයි නිර්වාණය - අනිත් එක තමයි ප්‍රඥප්තිය.

රූප ධර්ම වලත් ඒ වගේ. රූප ධර්ම වලත් තියෙනව ඕලාරිකව ප්‍රකටව හිතට අරමුණු වී යන ධර්ම ස්වභාව තිබෙනවා. ඒ කියන්නේ අරමුණු වන ප්‍රත්‍යය ගුණය, හැකියාව තිබෙන දේවල් තිබෙනවා.

සමහර දේවල් තියෙනවා උපාදාය රූප කොට්ඨාස වල. ඊළඟට ඔය මහාභූත වලත් ආපෝ ධාතුව - තව උපාදාය රූපවල තිබෙන සමහර කොටස් ඔය ඉන්ද්‍රිය ධර්ම - එහෙම නැත්නම් පුරුෂ ඉන්ද්‍රිය - ස්ත්‍රී ඉන්ද්‍රිය - ආකාශ ධාතු ආදී මේ දේවල්වල අරමුණු වීම් ශක්තිය තිබෙනවා නමුත් ප්‍රකට නෑ. ඒවගේ ගුණ ප්‍රභේද සූක්ෂම අරම්මණ ප්‍රත්‍යය ප්‍රභේද ඕවගේ අස්සේ තියෙනවා. ඒවත් අපි දැන ගන්න ඕන.

විශේෂයෙන්ම මේකෙදී තේරුම් ගත යුතු පළවෙනිම කාරණය තමයි මේ ලෝකේ තියෙන සෑම දේකම තිබෙනවා සිතක් පහළ වීමට උපකාර වන්නාවූ, හිතක් පහළවෙන්ට ආරම්මණ ප්‍රත්‍යයයෙන් උදව් වෙන්නාවූ, උපකාර වෙන්නාවූ අනිත් චිත්ත චෛතසික ධර්මයන්ට අරමුණක් හැටියට ඉදිරිපත් වන්නාවූ ගුණ විශේෂය - ධර්ම විශේෂය.

අපි හැම එක්කෙනාටම තිබෙනවා ප්‍රතිසන්ධි අවස්ථාවේදී හට ගන්න හිතක්. ඒකට කියනවා 'පළවෙනි සිත' – 'ප්‍රතිසන්ධි සිත' කියල. ඒ ප්‍රතිසන්ධි සිත නිකම් පහළ වෙන්නේ නෑ. ඒකට අරමුණක් අවශ්‍යයි. අපි හැම එක්කෙනාම මෙහෙ ඇවිල්ල ඉන්නේ අරමුණක් හැටියට හෝ වේවා පරණ ජීවිතයේදී ගත්තු එකක් මෙහෙ ගහගෙනයි. අපි කිසිම රූපයක් මෙහෙට ගෙනැල්ල නෑ, එහා ලෝකෙන්. මීට ඉස්සරවෙලා ලෝකෙන් හැබැයි අරගෙන ඇවිල්ල තිබෙනවා එක අරමුණක්. ඒ අරමුණ කර්ම ආරම්මණය හෝ කර්ම නිමිති ආරම්මණය හෝ ගති නිමිති ආරම්මණය හෝ වේවා ඒ අරමුණු තුනෙන් එකක්. ඒ අරමුණු තුනෙන් එකක් අරගෙන තමයි ප්‍රතිසන්ධි සිත පහළ වෙන්නේ. ඒ අරමුණට පුළුවන් ප්‍රතිසන්ධි සිතකට අරමුණු වෙලා පවතින්ට - ප්‍රතිසන්ධි සිතක් හදන්ට - ප්‍රතිසන්ධි සිතේ චෛතසික ධර්ම හදන්ට ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය ශක්තිය තිබෙනවා.

මේක මෙහෙම කියන කොට කෙනෙකුට හිතෙන්ට පුළුවන් මෙන්න මෙහෙම අදහසක්. ඒක පරෙස්සමින් දරන්ට කියල ඔය ගෞරවනීය ස්වාමීන්වහන්සේලාත් ඒවාගේම පින්වන්ත ස්වාමීන්වහන්සේලා මතක් කරනවා ශ්‍රාවකයන්ට මේ විදියට. දැන් මේ කථාව කියන කොට තේරෙනවා චිත්ත චෛතසික ධර්මයන් පහළ වීමට 'ආරම්මණය' ප්‍රත්‍යයක් හැටියට උපකාරයක් වෙනවා. එතකොට කෙනෙකුට හැඟීමක් එන්න පුළුවන් - අදහසක් එන්න පුළුවන් චිත්ත චෛතසිකයන් උපදවන්නාවූ බලයක් අරමුණු වලට තියෙනවය කියල. ඒක නිසා අරමුණු වලින් තමයි චිත්ත චෛතසික හැදෙන්නේ - හටගන්නේ කියල හැබැයි චිත්ත චෛතසික ධර්මයන් උපදවන හැකියාවක් ආරම්මණේට නෑ. චිත්ත චෛතසික ධර්ම පහළ වෙන්නේ අරමුණේ තිබෙන මහා ආනුභාව ගතියක් නිසා නෙවෙයි. අරමුණේ තිබෙන්නේ ඒ ඒ ඉන්න තැන්වල ඉඳගෙන පහළ වෙන්නාවූ චිත්ත ධර්මයන්ට චෛතසික ධර්මයන්ට තමන් පෙනේවා දැනේවා වැටහේවා මම මෙහේ ඉන්නවා කියල කියන්නා වගේ නිකං එයාට පෙනෙන්ට ඉන්න එකක් විතරයි. චෛතසික ගිහිල්ලා 'දැන් මම ඇවිල්ල ඉන්නවා මාව දිහා බලන්ට - මාව අරමුණු කරගන්ට - මාව දැනගන්ට - මාව අවබෝධ කර ගන්ට' කියල සිත්වලට ගිහිල්ලා නිදාගෙන ඉන්න චිත්ත චෛතසික ධර්ම තට්ටු කරලා අවදි කරවා ගන්න

ගතියක් අරමුණු වලට **නෑ.** තියෙන්නේ එන්නාවූ හිත්වලට ඉන්න ඉන්න තැන් වල ඉදලම ගණන් කරගන්ට උපකරවන්නාවූ ගතියක් විතරයි.

දැන් අර තියෙනවනේ මනුස්සයෙක් පේළියට තියල ඉන්නාවූ ළමයි ටිකක් ගණන් කරනවා. ළමයි දහ දෙනෙක් පේළියට තියල තියෙනවා. ළමයි දහ දෙනා ගණන් කරනවා. එකයි දෙකයි තුනයි හතරයි පහයි හයයි හතයි අටයි නමයයි දහයයි කියල. දැන් එතකොට මෙයා ගණන් කරගෙන යනවා. ඒ ගණන් කරගෙන යන කොට මේ ළමයින්ගේ හැකියාවක් නෑ අර මනුස්සයාට 'මාව ගණන් කර ගනීවා - මට එක කියාවා - මට දෙක කියාවා - මට තුන කියාවා - මට හතර කියාවා' කියල අර ගණන් කරන්නාවූ කෙනාට බලකිරීමේ හැකියාව ඒ ළමයින්ට නෑ. නමුත් ඒ ගණන් කරගෙන යන පේළියේ එක ගානකට එක සංඛ්‍යාවකට තමන් නියෝජනය වීම් ගතිය පමණක් තියෙනවා. ආන්න ඒ වගේ මේ අරමුණු වලට සිත් උපදවන්ට බෑ හැබැයි උපදින්නාවූ සිත් වලට අරමුණක් හැටියට ඉදිරිපත් වීමේ ගුණ විශේෂය විතරක් තියෙනවයි කියල හරි පරෙස්සමින් අපි හිතේ මේක තියාගන්ට ඕන.

මනෝ ද්වාරයට තිබෙනවා ධර්ම ස්වභාවයක්. ඒවා හරිම සියුම්. අපි කිව්වා සමහර අරමුණුවල ඕලාරික ආරම්මණ තිබෙනවා. සියුම් ආරම්මණ තිබෙනවා. දකින දේවල් අහන දේවල් දෙකේ හරිම ඕලාරික ආරම්මණ ශක්තියක් තිබෙනවා. ගඳ - සුවඳ - රස - ස්පර්ශ යන ආරම්මණ ඕලරිකත්වයෙන් සියුම් වෙලා නමුත් අරමුණු වීම ඒකාන්තයෙන්ම සිද්ධ වෙනවා. ඊළගට මනසේ ඇතිවන්නාවූ ධර්ම ස්වභාව අරට වඩා සියුම් හැබැයි අරමුණු වීම ඒකාන්තයෙන්ම තිබෙනවා. මනසේ හැදෙන්නාවූ සිතුවිලි සහ ඒ ඡායාවල් ඒ ඒ තැන් වලදී හිත් වලට ආරම්මණ ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙනවා. මේකේ සරලව කියන්න තියෙන්නේ නිවනත් අරමුණු වෙනවා රූපත් අරමුණු වෙනවා ප්‍රඥප්තියත් අරමුණු වෙනවා සියලුම දේවල් අරමුණු වෙනවා. අරමුණු නොවී පවතින්නාවූ කිසිම දෙයක් මේ ලෝකයේ සහ ලෝකයෙන් එහා පැත්තෙත් නෑ. ඒනිසා මේ හැම එකකටම තියෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය. එකේ අඩු වැඩි වීම් විතරක් වෙනවා.

මේකේ තේරුම් ගන්න තියෙන්නේ - සිත් 89 ක් කිව්වනේ. සිත් 89 යත් ආරම්මණ ශක්තිය තිබෙන ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නාවූ දේවල්. චෛතසික 52 ක් කිව්වා ඒ 52 ම ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නාවූ ධර්ම. රූප 28 ක් කිව්වා මේ රූප 28 ම තියෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තියේ තිබෙන ගුණය. නිර්වාණ ධාතුවට තිබෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තියේ තිබෙන අරමුණු වීම් ගුණය. ප්‍රඥප්තියේ සියලු දේවල්වලට - ඉංග්‍රීසි භාෂාවෙන් කියන දේවල්ද -

සිංහල භාෂාවෙන් කියන දේවල්ද - දෙමළ භාෂාවෙන් කියන හැම වචනයකටම තිබෙනවා ප්‍රඥප්තිය හැටියට හිත්වලට අරමුණු වීමේ ලක්ෂණය. ඒ නිසා අපි තේරුම් ගත යුතුයි කිසිම දෙයක්, ලෝකයෙන් හෝ ලෝකයෙන් පිට හෝ ලෝකෝත්තර වශයෙන් අරමුණු නොවන කිසිම ධර්ම ස්වභාවයක් නෑ.

ඊළඟට මේකේ තිබෙනවානේ - දැන් අරමුණු වෙනවා කියල කියන්නේ ආරම්මණ ප්‍රත්‍යයයි, ආරම්මණ ප්‍රත්‍යයයෙන් හටගන්න දේ ප්‍රත්‍යය උප්පන්නයි කියල කියනවනේ. 'ආරම්මණ ප්‍රත්‍යයයෙන් හටගන්න දේ ප්‍රත්‍යය උප්පන්නයි'. සෑම අරමුණක්ම දැන ගන්නා වූ සිත් සහ චෛතසික ධර්ම ටික සියල්ලක්ම ප්‍රත්‍යය උප්පන්නයි. මෙතනදී විශේෂයෙන් ඔන්න මේ කාරණා ටික අපි තේරුම් ගත යුතුයි.

අපි අද අලුත් පාඩමක් මේ කථා කරන්නේ. අලුත් පාඩමකටයි අපි ඇවිල්ල ඉන්නේ. මේ ආරම්මණය පිළිබඳව මිට කලිනුත් කියල දුන්න. මම මේ අවස්ථාවේ ඉදල ඉදිරියට මේ පින්වතුන්ට අවස්ථාව දෙනවා ප්‍රශ්න ටිකකුත් අහන්න. ඒ ප්‍රශ්න ටිකක් අහල ඒ ප්‍රශ්න වලට අපි පිළිතුරු ටිකකුත් සපයාගෙන අපි අද මේ දහම් වැඩ සටහන පිං දීමෙන් අවසන් කරමු.

දැන් මේ පිංවත් සෑම දෙනාටම අද මම කියල දුන්නේ ආරම්භකයක් හැටියට 'ආරම්මණ ප්‍රත්‍යය' පිළිබඳව - ආරම්මණ ප්‍රත්‍යයයේ තිබෙන්නාවූ 'ප්‍රත්‍යය ශක්තියත්' එක්ක උපකාර වන සිත්වලට උපකාර වන ගුණය. ඊළඟට ඒවගේ අඩු වැඩි ප්‍රභේදයක් කිව්වා. ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට කියල දුන්නේ සිත සහ චෛතසික. **කවදාවත්ම අනිත් ධර්මතා තුන ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ නෑ.** ඒකියන්නේ රූපය ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ නෑ. ඊළඟට නිර්වාණය ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ නෑ. ප්‍රඥප්තිය ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ නෑ. ඒවා 'ආරම්මණ ප්‍රත්‍යයයෝ' පමණයි.

ප්‍රායෝගිකවත් අපි මේක හිතල බැලුවැයින් පස්සේ - අපි බිත්තියක් දිහා බලාගෙන ටිකක් ඉන්නකොට ඒ බිත්තිය ගැන තිබෙන cream පාටක් හෝ සුදු පාටක් හෝ අපිට පේනවා. පේනවාය කියල කියන්නේ ඒ බිත්තිය පැත්තට හරවාගෙන තියෙන්නාවූ ඇස් දෙක තුලින් ඒවෙලාවට ඒ බිත්තියේ තිබෙන්නාවූ වර්ණය අරගෙන චිත්ත චෛතසික පහළ වෙනවා. ඒ චිත්ත චෛතසික ධර්මයෝ පහළ වෙනකොට පේනවා දැන් මේ බිත්තිය එතනම තියෙනවා. බිත්තිය ඇහේ වදින්නෙත් නැතුව හැපෙන්නෙත් නැතුව මේ මගේ හිතේ මේ බිත්තිය සම්බන්ධයෙන් ඕනෑ එකක් හැටියට හරි එපා එකක් හැටියට හරි හිතවන්න ඒ

බිත්තිය සම්බන්ධයෙන් චෛතසික ටිකක්, සිත් ටිකක් උපදවන්ට පුළුවන් ගතියක් ඒකෙ තියෙනවා. ඒක හින්ද තමයි මට මේ විදියට මේ බිත්තිය ගැන හිතෙන්නේ. බිත්තිය ගැන කල්පනා වෙන්නේ. බිත්තිය ගැන බලන්ට ඕනැයි කියල ඇහැ අහකට ගන්නේ නැතුව පවත්වාගෙන ඉන්නේ ඒකයි. මෙහෙම බැලුවයින් පස්සේ අපිට තේරෙනවා මේ ඉස්සරහ තියෙන බිත්තියේ තිබෙනවා ආරම්මණ ප්‍රත්‍යය ගතියක්. ඒකෙ තිබෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තියක්. එතන ඉන්නවා - එතන ඉඳගෙනම මෙතැන හිත් හදවන්න උපකාර වෙන්ට පුළුවන් ගතියක්. අහසේ වලාකුළු වලත් තියෙනවා. පියාසර කරන plane වලත් තියෙනවා. වාහන වලත් තියෙනවා. හැම එකේම ඔය ප්‍රත්‍යය ගුණය - ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙන - උපකාර වෙන ගුණය තියෙනව. ඒ නිසා මේක ඇවිල්ල පට්ඨානයක්. ප්‍රත්‍යය ගැන කථා කිරීමක්. මේ පට්ඨානයේ ප්‍රත්‍යය ධර්ම 24 ක් කිව්වා. ඒ 24 රේ දෙවෙනි අවස්ථාව මේ කථා කරන්නේ. තව තියෙනවා ගොඩක් කියන්න. හිතෙන් හිතට අරමුණු වන අරමුණු. ඊළඟට ඒ හිත්වල ඒ අරමුණේ බලයෙන් පහළ වෙන - පහළ කරවන - පහළ වෙන්ට උපකාර වෙන ආරම්මණ ස්වභාවය සිත් 89 ටම කියන්න පුළුවන්. සිත් 89 අරමුණු කරන්නේ එක අරමුණක් නෙමෙයි. සිත් 89 ම අරමුණු කරන්නේ විවිධ අරමුණු. අවස්ථාවත් වෙනස්. ඒ නිසා මේ හිත් 89 යටම අරමුණු වෙන්නාවූ අරමුණු ගත්තම අරමුණු මහා රාශියක් තියෙනවා. ඒ හැම එකේම තියෙනවා ඒ ඒ හිත් පහළ වෙන්ට උදව් කරන ගතිය.

ඒක සරලව හිතා ගන්න. මේ පිංවත් සැම දෙනාටම මේ ලෝකයේ තිබෙන්නාවූ හා ලෝකය සම්බන්ධයෙන් පහළ වෙන හිත් ලෝකය සම්බන්ධයෙන් පහළ වෙන චෛතසික ධර්ම ලෝකයේ පිහිටා තිබෙන්නාවූ රූපමය අරමුණු ලෝකය සම්බන්ධයෙන් පවතින්නාවූ ප්‍රඥප්ති අරමුණු ඊළගට ලෝකෝත්තර වශයෙන් පවතින්නාවූ නිර්වාණ ධාතුව කියන ධර්මස්වභාවය යන මේ සියල්ලම අරමුණු වෙන ආකාරය හොඳට මෙනෙහි කරගෙන, ඒවගේ ඒ ශක්තිය තියෙනවයි කියල වටහාගෙන, ඒවගේ ශක්තියෙන් හිත් පහළ වෙනවා කියල තේරුම් අරගෙන, ඒක ප්‍රයෝගිකව හොඳට දැනගෙන, ඒවගේම ඒ අරමුණක් හැටියට සුද්ධ වූ අරමුණක් වන පිරිසිදු අරමුණක් වන කෙලෙස් ඇති කරන්නේ නැති අරමුණක් වන නිර්වාණය අරමුණු කරගෙන නිර්වාණය අරමුණු කරගත්තාවූ ඒ හිතටත් නොඇලී ඒකත් අයින් කරල ඒවගේම අරමුණක් කරන්නේ නැති නිර්වාණ ධාතුවට පිවිසිලා හැමදෙනාගේම හිත් නිවනින් නිවේවා කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා සැමදෙනාට තෙරුවන් සරණයි !

අපි මෙයින් ඉස්සරහට මේ පින්වතුන්ට - නවකයෝ ගොඩක් ඉන්නවා. ඒක නිසා ඒ අයටත් පිහිට වෙන්ට ඕන නිසා සරලව වැඩි ගැඹුරකට යන්නේ නැතුව අපි මේ ටික හසුරුවමු. හැමදෙනාටම ධර්ම අවබෝධය වේවා! ප්‍රශ්න අහන්න පුළුවන් විශේෂයෙන්ම මේ පිළිබඳව. අපි මෙතන ඉදල සාකච්ඡා කරමු. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි! ස්වාමීන්වහන්ස ඔබවහන්සේ සඳහන් කරා සමහර අරමුණු වල ශක්තියක් තිබෙනවා ආරම්මණ වශයෙන් ප්‍රත්‍යය වන ගතිය තදබල ලෙස තියෙනව කියල. එතකොට ස්වාමීන්වහන්ස ලෝකෝත්තර සිත්, නිර්වාණ ධාතුව වගේ ඒවා හැමදේකටම වැඩිය තද බල ලෙස අරමුණු වෙනවා කියල හිතන්න පුළුවන්. ස්වාමීන්වහන්ස ඒවගේම තදබල ලෙස ප්‍රත්‍යය වන සමහර අරමුණු තවත් කෙනෙකුට එසේ නොවන්ට පුළුවන් නේද ස්වාමීන්වහන්ස. එතකොට ඒකත් සාපේක්ෂව අරමුණ ප්‍රත්‍යය වීමේදී ප්‍රත්‍යය වන ස්වභාවය වෙනස් වෙන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස. පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - සමහර ඒවගේ තියෙනවා අරමුණු පුද්ගලයාගෙන් පුද්ගලයාට ආරම්මණය තද බල වෙන්ට පුළුවන් නමුත් ආරම්මණයක් හැටියට ප්‍රත්‍යයයේ හැටියට ගත්තැයින් පස්සේ සමහර ඒවගේ පැහැදිලිවම තියෙනවා ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය වැඩි ඒවා. සරලව මම කිව්වා වතුර තේ කෝපි වගේ දේවල්. ඊළඟට මේ සිත්වල තිබෙනවා වෙනසක්. ඔය නිවන ගැන කිව්වනේ. හිත්වල තිබෙනවා ප්‍රභේද. දැන් අරමුණක් හැටියට ඉදිරිපත් වන අරමුණු ඉස්සරහට පෙනී ඉන්න හිත් තියෙනවා. දැන් ද්වේශ සහගත සිත්වලට යම් යම් අරමුණු පෙනී හිටිනවා. ලෝභ සහගත සිත්වලට යම් යම් අරමුණු පෙනී හිටිනවා. ඉදිරිපත්වෙනවා. ඊළඟට සසංඛාරික හිත්වලට අරමුණු පෙනී හිටිනවා. ඒවගේ පෙනී හිටින කොට සමහර හිත්වලින් ඒවා ටිකක් වැඩිපුර හිතල හිතල හිතල ගන්න ගතියක් තිබෙනවා. මේ හිත්වල තිබෙනවා නුවණ කිසිසේත්ම වැඩ කරන්නේ නැති හිතුත් තියෙනවා. ඊළඟට නුවණ ටිකක් තියෙන හිතුත් තියෙනවා. ආරම්මණය ලෞකික වෙන්ට - ලොකු වෙන්ට ඒවා නුවණින් ගන්න ගතියකුත් තියෙනවා - හිතින් ගන්න ගතියකුත් තියෙනවා. සමහර හිත්වල හිතින් අරමුණ දැන ගත්තත් ප්‍රඥාවත් පොඩ්ඩක් ඒ හරියක තියෙනවා. දැන් ඔය ලෝකෝත්තර නිර්වාණ ධාතුවේ තියෙන්නේ - එතනදී හිතේ තිබෙන දැන ගන්න ගතිය යට කරගෙන ප්‍රඥාව ඉස්මතුවෙනවා. ඒ ප්‍රඥාව ඉස්මතු උනායින් පස්සේ, ඒවගේ අවස්ථාවක තමයි නිවන අහුවෙන්නේ. දැන් මේ ලෞකික

අවස්ථාවේ තිබෙන බොහෝ හිත්වල ප්‍රඥාව නෑ. හිතේ තිබෙන්නාවූ ගතිය අර එතන තිබෙන්නාවූ (ප්‍රඥාව නැතුව) වෙන එහෙකින් වහගන්නවා. ඒ වගේ හිතකට තමයි අරක අරමුණු වෙන්නේ. ඒ නිසා සරලව තේරුම් ගත්තොත් එහෙම ප්‍රභේදයක් තිබෙනවා. ප්‍රභේදයක් තියෙනවා කියන්නෙ අරමුණු වීම් ගතිය එකින් එකට - පොඩි සියුම් හැටියට - ලොකුවට තිබෙන - ඖලාරිකව තිබෙන ගතියක් තිබෙනවා. හැම එකේම අඩු උනත් වැඩි උනත් අරමුණුවීමේ ගතිය තිබෙනවා. ඔය මහත්තය අහපු ප්‍රශ්නයට එකක් තමයි ලෞකික වශයන් ගන්න ඒවගේ ආරම්මණ ප්‍රත්‍යයට හිත ප්‍රධාන වෙනවා ගොඩක් අනිත් එක ලෝකෝත්තර වශයෙන් යන කොට ඒ අරමුණු ගන්න එකට ප්‍රඥාව ප්‍රධාන වෙනවා. ඒ නිසා අපි කියනවා ලෞකික ආරම්මණය හිතින් දැන ගන්නවා (එහෙම භාවිතා කරනවා) ලෝකෝත්තර ආරම්මණය ප්‍රඥාවෙන් දැනගන්නවා කියල. තෙරුවන් සරණයි!

බොහොම පිං ස්වාමීන්වහන්ස ඒ කියන්නේ යම් කිසි අරමුණක් වැඩි චෛතසික ධර්ම වලින් අරමුණු වෙනවනම් එහෙනම් ඒ අරමුණ වෙන්න ඕන වැඩියෙන්ම ප්‍රත්‍යය වෙන්නේ එහෙම හරිද ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - එහෙම තමයි මහත්තය එහෙම තමයි. ඒක තමයි කිව්වේ. අරමුණු වීම් ගතිය වැඩියෙන් තියෙනවනම් එතකොට ඒ අරමුණ සම්බන්ධයෙන් වැඩියෙන් වැඩියෙන් හිතව ගන්ට ශක්තිය තියෙනවා. ඕක සරලව කිව්වොත් එහෙම මිනිස්සු හැඩ වැඩ වෙනවනේ. කොන්ඩේ පීරනවා. එයිට පස්සේ colour කරනවා. ඇස් පිහාටු හදනවා - පාට කරනවා. ඊට පස්සේ ඇඳුම් අඳිනවා. එක එක මෝස්තර කරනවා කරාබු මාල පලඳිනවා. ඔය හැම එකකම තියෙන්නේ - ඒක කරන්නේ අනිත් මිනිස්සුන්ගේ හිත්වල තමා පිළිබඳව වැඩියෙන් වැඩියෙන් හිතාවා - වැඩියෙන් වැඩියෙන් බලාවා - වැඩියෙන් වැඩියෙන් කථා කරාවා කියල කියන ගතියක්නෙ තියෙන්නේ. ආන්න ඒ වගේ. උදාහරණයක් හැටියට මම කිව්වේ. අරමුණු හුදෙක් එහෙම කරන්නේ නෑ. නමුත් මේ කිව්වේ අර අනිත් අය ගැන වැඩි අවධානයක් හිතවා ගැනීමක් කරන්න තමයි attraction එකට ඔය සැරසිලි ආදිය කරන්නේ. ඒවගේ ගතියක්.

බොහොම පිං සවාමීන් වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - අපේ පින්වතුන් මේ කියන කාරණා ප්‍රධාන වශයෙන් අමතක කරන්න එපා. මේකට කියන්නේ ‘පට්ඨානය’ කියල. මේ පාඩම පට්ඨානය යටතේ එන්නේ. ඒක නිසා ප්‍රත්‍යය ධර්මයන්ගේ - උපකාරක

ධර්මයන්ගේ උපකාර වීම් ස්වභාවය තමයි මේ කථා කරන්නේ. කිසිම දෙයක් ලෝකයේ එක ප්‍රත්‍යයකින් හට ගන්න එකක් නෑ. ඒක හේතුක එකක් ලෝකයේ කිසිම තැනක නෑ. බහු හේතුකයි. ඒ නිසා මේ ඒ බහු හේතුක ධර්මයන් පිළිබඳව කථා කරන එකේදී ඒවා හේතු වන ආකාරය බහු හේතු හැදෙන හැටි එක පාරටම කියන්න බැරිනිසා ප්‍රත්‍යය ධර්ම 24 ක් කාණ්ඩ කරලා ඒ ප්‍රත්‍යය ධර්ම 24 ඉස්සෙල්ලා වෙනම ඉගෙන ගන්න ඕන. අපි ඒ ඉගෙනගන්න යන ගමන් මගේ එක අවස්ථාවක් මේ. ඒනිසා මේ ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව තමයි මේ කිව්වේ. ඒක නිසා මේ පින්වතුන් හොඳට අවදානයෙන් සාවධානයෙන් අහගන්න. ඒවාගේම අපේ අලුතින් ඇවිල්ල ඉන්න පින්වතුන් මේවා තේරෙනවද වැටහෙනවද නැත්ද කියල ඒකත් තමාගේ හිතින්ම අහන්න. ප්‍රශ්න තියෙනවනම් අහන්න. එතකොට මතුකරලා පැහැදිලි කරලා දෙන්න පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි! ස්වාමීන්වහන්ස මෙතන ආරම්මණ හැටියට නිර්වාණයත් ප්‍රඥප්තියත් කියන දෙකම සලකනවා. එතකොට ස්වාමීන් වහන්ස ඇත්තටම අපි නිවන අරමුණු කරනවා කියන්නේ - දැන් අපි සාමාන්‍යයෙන් දන්නවා මාර්ග සිත් පහළ වෙන අවස්ථාවේදී ත්‍රිලක්ෂණය අරමුණ කරනවා කියන අර්ථය තමයි හුඟක් වෙලාවට කියවෙන්නේ. එතකොට ත්‍රිලක්ෂණය කියන එකද නිවන අරමුණු කරනවා කියල කියන්නේ කියලත් ප්‍රශ්නයක් මතු වෙනවා. ස්වාමීන්වහන්සේගෙන් ඒකට පිළිතුරු ලැබුනට පස්සේ මම ඊළඟ ප්‍රශ්නය අහන්නම් ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - මහත්තය ඒක අහපු එක හොඳයි. ඒකට මම දැනගෙන තේරුම් අරගෙන තිබෙන කාරණය මම මේ පින්වතුන්ට මතක් කරන්නම්. ඒක හැබැයි රුල්ලේ යන එහෙකට ගැලපේද නැත්ද කියන එක පිළිබඳ මට අදාළ නෑ. හැබැයි එහෙම ගැලපෙන්නත් පුළුවන් නැති වෙන්නත් පුළුවන්. හැබැයි මට 100% විශ්වාසයි මේක ධර්ම විරෝධී නෑ කියල. ඒක නිසා මම මේ ජයන්ත මහත්තය අහපු ප්‍රශ්නයට මම මේක කියනවා මේකට උත්තරේ. ඔය සමහර දේශනාවල කරුණු විග්‍රහ කරලා තිබෙන්නාවූත් දේවල් එක්ක හැප්පෙන්න පුළුවන් මේ කියන කාරණයත් එක්ක. නමුත් හොඳට අහගෙන ඉන්ට එතකොට ඊට පස්සේ මේ පින්වතුන්ට තේරේවි.

දැන් මේ ජයන්ත මහත්තය ඇහුවේ මාර්ග අවස්ථාවේදී සිද්ධ වෙන ඒ මාර්ග සිත් වලට නිවන අරමුණුවන තැනක්. හොඳට තෙරුම් ගන්න මාර්ග සිත් ඵල සිත් කියන ඒවාගෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම බලන්නේ නෑ කියල. වාක්‍ය නැවත කියනවා 'මාර්ග සිත් වලින් - ඵල සිත් වලින් අනිත්‍ය බලන්නේ නෑ. දුක

බලන්නේ නෑ. අනාත්මය බලන්නේ නෑ'. ලෝකෝත්තර සිත් වලින් අනිත්‍ය බලන්ට බෑ. මාර්ග සිතෙන් අනිත්‍ය බලන්ට බෑ. ඵල සිතෙන් අනිත්‍ය බලන්ට බෑ දුක බලන්ට බෑ අනාත්මය බලන්ට බෑ. මාර්ග සිතෙන් බලන්නේ අනිත්‍ය නැති ධර්‍මයක් - මාර්ග සිතෙන් දකින්නේ බලන්නේ දුක් නැති ධර්‍මයක් - මාර්ග සිත් වලින් බලන්නේ ආත්ම නැති ධර්‍මයක්. එතකොට අනිත්‍ය බලන්න බෑ මාර්ග සිතෙන්. අනිත්‍ය නෑ කියල කියන්නේ නිත්‍ය ධර්‍මයක්. ඒ නිවනයි. දුකක් නෑ කියල කියන්නේ නිවනයි. ආත්ම ස්වභාවයක් නෑ කියල කියන්නේ නිවනයි. මේක ඇවිල්ල මේ මාර්ග සිත්වලට 'නිවන' කියන අනිත්‍ය නැති ධර්‍මයක් - දුක නැති ධර්‍මයක් - ආත්ම නැති ධර්‍මයක් පෙන්නුම් කරන්නේ, පෙන්න ගන්නේ සහ අරමුණු වෙන්නේ, ඊට කලින් එනම් මාර්ග සිත් වලට කලින් පහළ වෙච්ච සිත්වලින් අනිත්‍ය බලපු නිසයි. අනාත්මය බලපු නිසයි. දුක බලපු නිසයි. මාර්ග සිතට මාර්ග සිත් පේළියේ කලින් සිත්වලට ඒ කියන්නේ ගෝත්‍රභූ සිතත් නෙමෙයි, ඊටත් කලින් සිත්වලට කවදාවත් නිවන අහු වෙලා නෑ. ඒවාට පෙන්නේ නිවන නෙමෙයි. අනිත්‍ය වන ධර්‍මයක්. ඒ සිත්වලට පේන්නේ දුක් වන ධර්‍මයක්. ඒ සිත්වලට පේන්නේ අනාත්ම වන ධර්‍මයක්. ඊළඟට තව එකක් තිබෙනවා - මේක ටිකක් track ඒකෙන් අහකට පැන්න - නමුත් මේක කිව්වොත් ඉවර කරන්න පුළුවන්. විදර්ශනා අවස්ථාවේ තිබෙනවා ප්‍රධාන වශයෙන් සලකන්න පුළුවන් අවස්ථා දෙකක්. ඒ තමයි සංස්කාර ධර්‍ම කියල තේරුම් ගන්න අවස්ථාව. සංස්කාර, සංස්කාරයෝ කියල වෙන්කරගෙන වෙන්කරගෙන වෙන්කරගන්න අවස්ථාව, හැබැයි ඒකෙ සංඛාර ලක්ෂණ බලන්නේ නෑ. සංස්කාර හැටියට ඉස්සෙල්ල ගොඩවල් කරගත්ත.

තෝරාගන්න සංස්කාර ටිකේ අස්සේ තිබෙනවා බැලිය යුතු දේවල්. රූප සංස්කාර වේදනා සංස්කාර සංඥා සංස්කාර විඥ්ඥාණ සංස්කාර යන මේවා ඔක්කොම වෙන් කරගෙන ඊට පස්සේ ඒවගේ අස්සේ තිබෙන්නාවූ හැංගිලා තිබෙන ධර්‍ම ටික කඩල කඩල උඩට ගන්නවා. ඒ තමයි හැම එකකම තියෙන අනිත්‍ය ලක්ෂණය - අනිත්‍ය වන ගුණය. දුක්ඛ වන ලක්ෂණය - ගුණය. අනාත්ම වන ලක්ෂණය - ගුණය. මේ ධර්‍ම සංස්කාර අස්සේ හැංගිලා තියෙන්නේ. ඒක මතුකරගෙන අර සංස්කාර බිඳල, හැංගිලා තිබෙන හොරු අල්ලන්න වගේ ඒ කරන වැඩේ උපරිමයට කියනවා විදර්ශනාව කියල. ඉස්සෙල්ල සංස්කාර තේරුම් ගත්ත පස්සේ සංස්කාර අස්සේ හැංගිලා තිබෙන්නාවූ ලක්ෂණ තේරුම් ගන්නවා. ඒක තමයි හොඳම විපස්සනාව. ඔය දෙකම ඇවිල්ල ලෞකිකයි. දැන් සංස්කාර බැලුවත් ලෞකිකයි, සංස්කාරයන්ගේ ලක්ෂණ බැලුවත් ලෞකිකයි. එහෙම බලාගෙන බලාගෙන බලාගෙන ගිහිල්ලා ඒක කරන්න පුළුවන් කම

තියෙන්නේ නිර්වාණ මාර්ගයට මෙහා පැත්ත දක්වා විතරයි. හැබැයි මෙච්චර කල් බල බලා හිටියේ නිවන් නෙමෙයි. ඒ තමයි සංස්කාර අස්සේ තිබෙන ධර්‍ම. ඊට පස්සේ ඒ ටික ඔක්කොටම පයින්ගහල ඒ පැත්තවත් බලන්නේ නැතුව ඒ පැත්තට පස්ස හරවල ඊට පස්සේ ඉදිරිය බලනවා. ඒ තමයි මාර්ග සිතෙන් නිවන් බැලීම. ඒක නිසා කවදාවත්ම අනිත්‍ය බලන හිතකට නිවන් පෙන්නේ නෑ. නිවන් බලන හිතකට අනිත්‍ය පෙන්නේ නෑ. අනිත්‍ය පෙනීමේ result එකක් හැටියට තමයි නිත්‍ය නිර්වාණය දකින හිත පහළ වෙන්නේ. සම්පූර්ණ දෙපැත්තක්. මේක මම හිතනවා තේරෙන්න ඇතෙයි කියල. හැබැයි ඔය විදියට තමයි මට තේරෙන්නේ. ඒක යම් යම් විදියකට controversial වෙන්න පුළුවන්. ධර්‍මය නම් ඕකයි. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස බොහොම පිං අනිත් ප්‍රශ්නය තමයි ප්‍රඥප්ති කියන කොට අපි දන්නවා ඔය මෛත්‍රී භාවනාව කසිණ වගේ දේවල් වලට ප්‍රඥප්ති අරමුණු භාවිතා කරනවා.එතකොට ස්වාමීන් වහන්ස ඒ වගේ ගැඹුරකට ගිහිල්ලා බලන කොට එහෙමයි නැත්නම් අපි එදිනෙදා සාමාන්‍ය ජීවිතයේදී ප්‍රඥප්තිය අරමුණු වෙන්නේ කොහොමද කියල පොඩ්ඩක් පැහැදිලි කරල දෙන්න ස්වාමීන්වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඇත්ත වශයෙන්ම තවම මම ආරම්මණය අත ගැහුවා විතරයි. තව list එකක් තියෙනවා ඉස්සරහදි දිග හරින්න. ප්‍රඥප්තියට අපි ගත්තොත් එහෙම ඉස්සර වෙලා ඔය ලොකු මහග්ගත සිත් වලට අරමුණු වෙන්නා වූ ඒ ප්‍රඥප්ති ආරම්මණයකට යන්න කලියෙන් අපි එදිනෙදා අපේ ආශ්‍රයේ තිබෙන අපේ ආශ්‍රයෙන් හොයා ගන්න පුළුවන් ටිකක් ගත්තොත් ඒක හරි ප්‍රායෝගිකයි. එහෙම බැලුවොත් එහෙම අපි හිතමු - ඒක දැනගන්නේ මෙහෙමයි. ගස කියල කිව්වයින් පස්සේ අපි ධර්‍මය ගැන නොසිතන නිසා අපට තේරෙන්නේ අරමුණු වෙන්නේ එකයි. ඒ තමයි ගහ කියන රූපය හිතේ ඇඳෙනව. ධර්‍මය ගැන හොඳට සිහිපත් කරන කොට ඒ ධර්‍මය බලන්ට ගහ කියල කිව්වට පස්සේ ගස කියන කොට, ගස කියල කියන්නේ මෙන්න මේකයි - මේවගේ හැඩයක් තිබෙන එකක් - ඒ හැඩය තිබෙන එහෙකට දීපු ශබ්දය මේකයි කියල - ඊළඟට අර ගස කියන වචනය වෙනම අරමුණු කරනවා - ගස කියන වස්තුව වෙනම අරමුණු කරනවා. ප්‍රඥප්තිය කියල කියන්නේ අර ගස කියපු වචනය කියන එකයි. ඒ වචනයයි. දැන් අපි මේසය කියල ගත්තම අපේ හිතට දැනෙනවා යම් කිසි හැඩයකට තියෙන ලෑල්ලක් හයි කරපු කකුල් තියෙන වස්තුවක්. ඒ වස්තුව - ඊළඟට ඒකට දාපු

වචනය - 'මේසය' කියන එක වෙනම අරමුණු වෙනවා. අපි ඇඳගෙන ඉන්න ඇඳුමට ඇඳුම කියල කියනවා - ඇඳුම කියන වචනය - ඒ ශබ්දය - ප්‍රඥප්තිය වෙනම අහුවෙනවා. ඒක නිසා සෑම වස්තුවකටම - පිඟානය කියන එක - කෝප්පය කියන එක - පිහිය- කැත්ත කියන මේ හැම එකේම වස්තුව වෙනම හිතට අහුවෙනවා - ඒ වස්තුව හඳුන්වන්න දාපු 'නාමය' කියන එක 'වචනය' කියන එක වෙනම හිතට දැනෙනවා. ඒ නිසා මේ අනන්ත අප්‍රමාණයක් වස්තු තියෙනවද ඒව හඳුන්වන්ට තියෙනවා ප්‍රඥප්ති. මේ කථාව කියාගෙන යනකොට සමහර ඒවට ප්‍රඥප්ති නැතුව වත්දෝ කියල හැඟෙනවා. හැබැයි එහෙම නැති වෙන්නේ නෑ. ලෝකයා මොකක්හරි සමාන ප්‍රඥප්තියක් හරි ඒකට පටලවාගෙන තියෙන්නේ. දැන් අපි හිතමු - මම මේක කලිනුත් කියල තියෙනවා - පිඟාන කියන එක පැතලියි. එතකොට පිඟාන කියපු ගමන්ම අපිට පිඟාන කියන පැතලි වස්තුවක් පේනවා, පිඟාන කියන වචනය වෙනම හිතට දැනෙනවා . මේකට කියන්නේ මේ වචනය - පිඟාන - කියල. එතකොට පිඟාන කියන වචනය හෙවත් ප්‍රඥප්තියයි, පිඟාන කියන වස්තුවයි දෙකක්. එතකොට දෙකම වෙන වෙනම අරමුණු වෙනවා. කෝප්පය කියනවා. කෝප්පය කිව්ව ගමන් කෝප්පය කියන බොකුටු වස්තුවක් හිතට දැනෙනවා ඒකට කියන කෝප්පය කියන වචනය වෙනම දැනෙනවා. එතකොට අරමුණු දෙකයි. අර වචනය තමයි ප්‍රඥප්තිය. දැන් ඔය දෙකට ප්‍රඥප්ති දෙකක් තියෙනවා - පිඟානය කියනවා කෝප්පය කියනවා. ප්‍රඥප්ති දෙකක් තියෙනවනේ. අපි ඔය දෙකටම මැදින් යන වස්තුවක් ගන්නවා. ඒ තමයි පිඟානය පැතලියි කෝප්පය බොකුටුයි. දැන් ගන්නවා පිඟානයේ ස්වභාවයෙන් බාගයක් තිබෙන කෝප්පයේ ස්වාභාවයේ බාගයක් තිබෙන වස්තුවක්. එතකොට ඒකෙ බාගයක් කෝප්පය වගේ කියන්න පුළුවන් බාගයක් පිඟාන වගේ කියන්න පුළුවන්. එකේ පිඟානය පැත්තට බරත් නෑ වැඩිපුර පැතලිත් නෑ වැඩිපුර බොකුටුත් නෑ ඒ අවස්ථවේදී ප්‍රඥප්තියක් පනවන්නේ කොහොමද? ඒ අවස්ථාවේදී ප්‍රඥප්තියක් පනවනවා පළාතේ හැටියටයි, ගමේ හැටියටයි, පුද්ගලයා හැටියටයි. අපේ ගෙදරට එහෙම කිව්වොත් අපේ අම්මලා තාත්තලා ඒක පිඟාන පැත්තට වැඩිපුර එහෙම තිබුනොත් කියනවා පිඟානය කියල කියන්නේ නැතුව 'පිඟාන වගේ' කියන ප්‍රඥප්තිය හඟවනව. ඒක තමයි එතන ඒක හඳුන්වන ප්‍රඥප්තිය. දැන් පිඟානය කියල කෙලින්ම කිව්වෙ නෑ. කෝප්පය කියල කෙලින්ම කිව්වේ නෑ. හැබැයි උපකාරයක් ගත්ත පිඟානෙන් පිඟාන වගේ එක කියල අරකට දාල පැනෙව්වා. ඊට පස්සේ කෝප්පය පැත්තට බරනම් 'අර කෝප්පය වගේ තියෙන වස්තුව'කියල පනවනවා. ඔය කියන්නේ මිනිස්සු 'කුඩේ වගේ එක' 'සපත්තු වගේ එක' 'කාරෙක වගේ එක' 'ගහක්

වගේ' 'මේසයක් වගේ' යනුවෙන් 'වගේ' යන වචනය ළඟින් යන ප්‍රඥප්තියකට හේත්තු කරලා අලුත් ප්‍රඥප්තියක් හදා ගන්නවා. ඒක නිසා පැනවීම් මහා ගොඩක් තිබෙනවා. ඔය සෑම දේකම අපිට හිතෙන, දැනෙන දේට දාපු වචන මාත්‍රය තමයි ප්‍රඥප්තිය කියල කියන්නේ. ඒක තමයි ලෞකික වශයෙන් දැන ගන්නේ. හැබැයි අර මහග්ගත ස්වාභාවයට ගයැන් පස්සේ ඒ වැඩේ ටිකක් සියුම්. ඉස්සෙල්ල බලමු මේක ග්‍රහණය උනාද කියල. කොහොමද?

අවබෝධ උනා ස්වාමීන්වහන්ස. ඒ කියන්නේ අපි එදිනෙදා මොනවා හරි ගැන හිතන කොටත් අපි ඒ නමින් දැනගන්නවා. නම් වෙනම දැන ගැනීමත් ඒ නමින් අදහස් කරන දේ වෙනම දැන ගැනීමත් කියන එක තමයි ස්වාමීන්වහන්ස අපිට මතු කරල දුන්නේ කියල. දැන් මේ සාකච්ඡාව යන අවස්ථාවේදී ස්වාමීන්වහසේගේ කටහඬ අපිට ඇහෙනවා ස්වාමීන්වහන්සේව අපි දැකල තියෙන නිසා අපිට යම් කිසි රූපයකුත් ඒත් එක්කම මැවෙන ගතියකුත් තියෙනවා. එතකොට අපි සවන් දීල ධර්‍ම කරුණු අවබෝධ කර ගන්ට යන කොට ඒ කියපු වචන ටික අදහස් කරනවා, ඒක පිටිපස්සේ අර ස්වාමීන්වහසේගේ රූපය මැවීමකුත් තිබෙන බවක් තේරෙනවා ස්වාමීන් වහන්ස. ඒ විදියට තමයි දැනට තේරෙන්නේ ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි !

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි එහෙම හොඳයි.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අවසරයි - ස්වාමීන්වහන්ස මේ ප්‍රඥප්ති ප්‍රශ්නයක් නෙමෙයි. මට කලින් එකක්ගැන පොඩ්ඩක් දැන කර ගැනීමක් අවශ්‍ය යයි. ස්වාමීන් වහන්සේ දේශනා කලා අනිත්‍ය නෑ දුක නෑ ආත්ම නෑ කියන තැන නිවන කියල එතකොට ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අපිට පැහැදිලි කරා සංස්කාර ධර්‍මයන් ඉස්සෙල්ල වෙන්කර ගන්න කියල. එතකොට **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියල තථාගතයන් වහන්සේ එහෙම දේශනා කලේ **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියන තැන යම් දෙයක්ම හැදෙන්නේ මනස තුල. එතකොට ඒ හැදෙන සියලුම සංඛාර විදර්ශනා කිරීම තුලින් එනම් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් බැලීමට තමයි අපි ඉස්සෙල්ලම පිවිසෙන්නේ. හැබැයි ඒ පිවිසුනට පස්සේ ලෝකෝත්තර මාර්ග සහ මාර්ග ඵල වලට එනකොට එහෙම දෙයක් නැහැ කිව්වා. එතකොට ස්වාමීන්වහන්ස පටිච්චසමුප්පාද ධර්‍මයට අනුව - **ඉමස්මිං සති ඉදං හොති - ඉමස්මිං අසති ඉදං න හොති - 'න හොති'** කිව්වොත් නූපදින ස්වභාවයක් කිව්වහම අවිද්‍යාවත් නැති - අපිට කථා කරන්නත් දෙයක් නැහැ කියන වගේ දෙයක්ද ස්වාමීන් වහන්ස ඒ තුලින් අදහස් කරන්නේ.

<u>පිළිතුර</u> - මහත්තය ඒකෙ තියෙනවා මෙහෙම - සංඛාර කියන වචනය භාවිතා කරන කොට ඒ සංඛාර කියන වචනය භාවිතා කරන්නේ කොයි හරියෙද - මොන හැටියටද - මොන කාරණය මොනවිදියේ සම්බන්ධයෙන්ද කියන එක පිළිබඳව අපිට දැනුමක් තියෙන්න ඕන. හේතුව සංඛාර කියන වචනය භාවිතා කරනවා අර්ථ කීපයක. සංඛාර කියන වචනය භාවිතා කරනවා සංඛත සංඛාර කියල - සංඛත සංඛාර කියල කියන්නේ හේතු ගොඩකින් හැදෙන .. එතකොට තව තියෙනවා හේතු වලින් හට ගත්ත දේ වගේම අභි සංස්කරණය කරන්නාවූ සංඛාර තිබෙනවා. ඒ කියන්නේ ඉස්සරහට යමක් උපදවන්නාවූ - ඔය තියෙන්නේ පිං - පවු - හිතුවිලි - ඒවාගේ තාම ප්‍රතිඵලයක් උපදවල නැති නමුත් ප්‍රතිඵලයක් හදලදෙන්නාවූ ඒවාට කියනවා අභි සංස්කරණය කරන්නාවූ සංඛාර කියල. ඊළඟට තව තියෙනවා වීර්යයටත් කියනවා සංඛාර කියල. සරලව ගත්තයින් පස්සේ මේ ලෝකේ හේතුවලින් හටගෙන තියෙන දේවල් ඔක්කොම සංඛාර කියල පොදුවේ කථා කරනවා. දැන් ඔය **'සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං'** කියන තැන එතන සංඛාර කියල කියන්නේ කුසල් අකුසල් සිත් වල 'චේතනා' ධර්මයට. කුසල අකුසල සිත්වල තිබෙන්නාවූ චේතනාවත් එක්ක ගොඩගැහිලා තිබෙන්නාවූ ධර්ම. ඒකෙන් තමයි විඤ්ඤාණ හදල දෙන්නේ. දැන් **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියල කිව්වහම එකේ අවිද්‍යාව ප්‍රත්‍යය වෙලා සංඛාර උපදිනවා කියල කිව්වයින් පස්සේ අපි තේරුම් ගන්ට ඕනෑ අපිට දැනුමක් තියෙන්ට ඕනෑ මේ **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියල කියන්නේ **'පයෝගාභී සංඛාරද'** - **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියල කියන්නේ **'අභිසංකරණ සංඛාරද'** - **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියල කියන්නේ **'සංඛත සංඛාරද'** කියල මේ ගැන අපිට තියෙන්න ඕනෑ - වාක්‍ය කියාගෙන යනකොට අපිට තියෙන්න ඕන - 'මේ කථා කරන්නේ අහවල් තැනයි' කියල දැනුමක්. **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'** කියන තැන කථා කරන්නේ කුසල් සහ අකුසල් දෙක. ඒක ඇවිල්ල අභිසංස්කරණ ගතියක්. කුසල් සහ අකුසල් කියන සංඛාර හැදුන. ඒකට හේතු උනා අවිද්‍යාව. තව එකක් තමයි මහත්තය අවිද්‍යාව කියන එක අපි හිතමු කුසල් අකුසල් හදාගන්න උදව් වෙනවා කියල. ඒ කියන්නේ ප්‍රත්‍යය වෙනව කියල - හේතු වෙනව කියල. ඒ හේතු වෙන කොට හේතු වෙනවා ක්‍රම 9 යකින්. එකක් දෙකක් කියන්නම්. (1). එකක් තමයි මේ අවස්ථාවේදී ඇතිවෙච්ච අවිද්‍යාව ඊට පස්සේ අවස්ථාවකදී ඵලයකට හේතු වෙනවා. අවස්ථා දෙකක් එක විනාඩියේ නෙමෙයි. විනාඩි දෙකක කියමු. මේ විනාඩියේ පහළ වෙච්ච අවිද්‍යාව ඊළඟ විනාඩියේ ඇතිවෙන දේකට හේතු වෙනවා. එතකොට කියනවා අවස්ථා දෙහෙක සිද්ධ වෙන දේකට උදව් වෙනවා කියල. (2). අනිත් එක තමයි අවිද්‍යාව එක

මොහොතේ එක විනාඩියේ එක තත්පරේ තිබෙන්නාවූ තවත් ධර්‍මයකට උපකාර වෙනවා. ඒකට කියනව සහජාත භාවයෙන් අවිද්‍යාව උපකාර වෙනවා - නා නා ක්‍ෂණික වශයෙන් අවස්ථා දෙහෙක වශයෙන් අවිද්‍යාව තව එහෙකට උපකාර වෙනවා කියල. අපි මේ කථා කරන කථා කිරිල්ල ඇවිල්ල අවස්ථා දෙහෙක නෙමෙයි. අපි මේ ආරම්මණ ප්‍රත්‍යය එහෙම කථා කරන ඒවා - දැන් ඉස්සරවෙලා ආරම්මණයක් ඇතිඋනා පස්සේ දැන ගත්ත කියන තැනකුත් නෙමෙයි. මේක ඇවිල්ල ඒකක්‍ෂණිකයි, එක මොහොතක් සිද්ධ වෙන්නාවූ දේ. 'හේතු ප්‍රත්‍යය' ගැන කථා කිරීමයි මහත්තය **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං'** කියන එකයි - 'එක' මොහොතකට ගලපලා කථා කිරීමයි කියල කියන්නේ බොහෝම වෙනස් විධි දෙකක්. ඒක නිසා එකේ සරු ගතිය තියෙන්නේ 'සහජාත' නැත්නම් 'ඒක චිත්තක්‍ෂණයක ස්වභාවයේ'. ඉතින් මහත්තයාගේ මෙනෙහි කරන තැන මට තේරෙනවා, මහත්තය කථා කරන ඒ තැන ඒ කාරණය තේරෙනවා හැබැයි ඒක කියල දෙන්ට නම් ගොඩක් කියන්න වෙනවා. තව එකක් මහත්තය කිව්වා අරමුණු වීම් වශයෙන් - අරමුණු වීම් වශයෙන් තියෙන්නේ ලෝකෝත්තර සිතකට කිසිම අවස්ථාවකදී අරමුණු වෙන්නේ නෑ - විද්‍යාව අරමුණු වෙන්නෙත් නෑ අවිද්‍යාව අරමුණු වෙන්නෙත් නෑ. ලෝකෝත්තර සිතකට කිසිම වෙලාවක සංඛාර අරමුණු වෙන්නෙත් නෑ. විඤ්ඤාණ අරමුණු වෙන්නෙත් නෑ. 'හේතු - ඵල' ධර්‍ම රාමුවේ තිබෙන එක කැල්ලක්වත් අරමුණු වෙන්නේ නෑ. ලෝකෝත්තර සිත්වලට එහෙම සංඛාර පරාසයේ තිබෙන ඒවා අරමුණු වෙන්නේ නැහැ. අද කථා කරන්නේ ආරම්මණ ප්‍රත්‍යයනෙ. ඒක නිසා ඒකට අදාල අරමුණු වීම් පැති දෙක විතරයි මම කිව්වේ. මේක මම හිතනවා අපේ පින්වතුන්ට වැටහෙන්න ඇති කියල. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි අවසරයි ගෞරවනීය ස්වාමීන්වහන්ස මම හිතන්නේ මම අහන්න ගිය ප්‍රශ්නය ස්වාමීන්වහන්සේ දැන් විස්තර කරා. මමත් අහන්න හිටියේ ස්වාමීන්වහන්ස ආරම්මණ ප්‍රත්‍යය නිසා රූපයක් ඇසට ගෝචර උනාම එකේ වර්ණය නිසා අපේ හිතේ චක්ඛුවිඤ්ඤාණයක් ඇති වෙන්නේ පෙර කල හේතුවක ඵලයක් වශයෙන්නේද ඒක විපාක විඤ්ඤාණයක්නෙ. එතකොට ඒ අරමුණේ හැටියට කුසල හෝ අකුසල විපාකයක් ඇති උනහම ලෝකයක් නිර්මාණය වෙනවා. ඒ කියන්නේ ලෝභය ද්වේශයක් හෝ මෝහයක් නිර්මාණය වෙනවනේ. එතකොට ස්වාමීන්වහන්ස එතන හේතු ප්‍රත්‍යයක්නේ. මම අහන්න හිටියේ ආරම්මණ ප්‍රත්‍යය නිසා .....තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - යම් යම් අවබෝධ අපේ පින්වත් මහත්මියට තියෙනවා. අර ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව කථා කරන කොට අච්චර අහකට යන්නේ නෑ. ඒ කියන්නේ “චක්ඛුවිඤ්ඤාණය පහළ වෙන්නේ පෙර කලාවූ කර්මයකින් නිසා එකේ ප්‍රත්‍යයක් නිසා නේද ඒකට තමයි මේක අරමුණු වන්නේ” කියල කියන කොට ගොඩක් දුර ගිහිල්ලා. මේ කථාකරන කථා කිරිල්ල ඇවිල්ල චක්ඛු විඤ්ඤාණය ඉස්සෙල්ල කරපු කර්මයක් විපාක යක් හෝ වේවා නොවේවා හෝ ඒක අදාළ කරගන්නේ නෑ. මෙතනදී කරන්නේ මේ ආරම්මණයේ තිබෙන්නාවූ ගුණය අනිත් හිතකට පහළ වීම සඳහා ක්‍රියාත්මක වෙන උපකාර ශක්තිය කථා කිරීම් පමණයි. අර අපි බණ අහල තියෙවනේ ඔය ඕකයි ඕකේ වෙන්නේ. දැන් බණ අහල තිබෙන නිසා බණ පොත පත කියවල තියෙන නිසා අපි අහල තියෙනවනේ මේ හිතින් යම් කිසි දෙයක් දක්කයින් පස්සේ ඒක හිත ඇතුලට අරගෙන ඒ පිළිබඳ හිතාගෙන හිතාගෙන ගිහිල්ලා නැවත අපි ඇතුලත ලෝකයක් හදා ගන්නවයි කියල. ඒවා ඇවිල්ල අර විතර්ක කරලා හිත අවුස්සා ගන්න ප්‍රපංච ධර්ම සම්බන්ධයෙන් යන එකනේ. ඒ පිළිබඳව අපි අහල තිබෙනවා. ඒක නිසා අපි අහපු කෑලි මේ හරියට හෙමිහිට ගොඩ වෙනවා. එච්චර දුර යන්නේ නෑ. චක්ඛු විඤ්ඤාණයක් තියෙනවනම් චක්ඛු විඤ්ඤාණයෙ තියෙන්නේ චෛතසික ධර්ම 7යි. ඒ තමයි සර්ව චිත්ත සාධාරණ චෛතසික ධර්ම 7. ඊළඟට චක්ඛු විඤ්ඤාණය - ඒ චක්ඛු විඤ්ඤාණයයි චෛතසික ධර්ම 7යි පහළ වීම සඳහා ඒක පෙර කර්මයෙන් හෝ වේවා වෙන හේතුවකින් හෝ වේවා ඒ කථා කිසිම දෙයක් අපි සම්බන්ධ කර ගන්නේ නැතුව මේ චක්ඛු විඤ්ඤාණයට ඉදිරිපත්වුනේ අපි හිතමු ජරා ගොඩක් කියල ඒ ජරා ගොඩේ තිබෙනවා ඒ චක්ඛු විඤ්ඤාණය පහළ කිරීමට පුළුවන් යම් කිසි ගති ස්වභාවයක්. ඒ පිළිබඳව නැවත නැවත පාර දිගේ ගිහිල්ලා ඒ පිළිබඳව හිතවන්ට පුළුවන් - සිත් හදන්න පුළුවන් - චෛතසික ධර්ම හදන්න පුළුවන් ගති විශේෂයක් - අරමුණු වීම් විශේෂයක් ඒකෙ තියෙනවා. ආන්න ඒ ‘ආරම්මණ ප්‍රත්‍යය’ කියල කියන්නේ අපි එතන නවතින්ට ඕනෑ. දිගට ගිය ගමන් තියෙනවා - මනසේ ඇඳ ගත්ත මනෝමය ධර්මය - ඊට පස්සේ ආරම්මණය හිතේ තියාගෙන අරමුණු කරන ගතිය - ඒවා තියෙනවා. ඒක නිසා අමු අරමුණ - ඇතුලට ගත්ත අරමුණ - ධර්ම ආරම්මණය යන ඕවගේ විවිධත්වයකුත් තියෙනවා. හැබැයි මෙතන කථා කරන්නේ ඒ හැම අරමුණකම ඒ වෙලාවට අරමුණු වීම් වශයෙන් තිබෙන ‘ප්‍රත්‍යය ගුණය’ ගැන කථා කිරීම විතරයි. අච්චර දුර යන්නේ නැහැ. එහෙම උනොත් එහෙම පටලැවෙනවා. තෙරුවන් සරණයි!

බොහොම පිං තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස

<u>ජයන්ත මහත්මා</u> - හොඳයි එහෙනම් අද අපිට සාකච්ඡාව නිමාකරන්ට කාලය ඇවිත් තියෙනවා ස්වාමීන්වහන්සේගේ කාලයත් සලකල. එහෙම නම් ස්වාමීන්වහන්ස අනන්ත අප්‍රමාණ වාරයක් පිං මේ විදියේ ඉතාමත්ම ගැඹුරු දහම් කරුණු අපට මේ ආකාරයෙන් සරලව පැහැදිලි කර දීම ගැන. ආරම්මණ ප්‍රත්‍යය ගැනයි අපි අද ස්වාමීන්වහන්සේගෙන් අසා දැනගත්තේ. ස්වාමීන් වහන්ස එහෙම නම් අපිට මේ අවස්ථාව හැමදාම ලබා දෙන දළුවත්ත මහත්මයාටත් පුණ්‍යානුමෝදනාවක් කරමු තරමක අසනීපයෙන් පසුවෙන නිසා විශේෂයෙන්. අපි අද සාකච්ඡාව නිමා කරමු. ඔබ වහන්සේට අනන්ත අප්‍රමාණ පිං. අපි මේකෙන් උපදවාගත්ත සියලු කුසල ධර්‍මයන් ඔබවහන්සේට අනුමෝදන් කරනවා ස්වාමීන්වහන්ස. නිදුක් නිරෝගීව චිර ජීවනය උදාවේවා! මාර්ග ඵල නිවන් අවබෝධ වේවා! කියල ප්‍රාර්ථනා කරමින් ඔබවහන්සේට යොමු වෙනවා ස්වාමීන් වහන්ස තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි! සැපවේවා! ඉතින් අපේ පින්වත් ජයන්ත මහත්මයා එක්කාසුවෙලා අපේ ධර්‍මමණ්ඩලයේ සියලුදෙනාම පින්වතුන් එක්කාසු කරගෙන - ඇත්තවශයෙන්ම ගාම්භීරයි. සමහර තැන වලදී ගොඩාක් කියන්න තිබුනත් මම මේ ඇදල ගන්නේ නැත්තේ ටික ටික - ටික ටික මේක මේ හිත්වලට දාන්න ඕන නිසා. නැත්නම් එකපාරට එකින් ඉවරයි. ඒකට හේතුවක් තියෙනවා. අපි මේ පොඩි ළමයින්ට කෑම කවන කොට අම්මගේ අත ලොකුයි. ඉතින් ලොකු අතකින් හොඳට අනල අනල බත් ගුලියක් අරගෙන පොඩි දරුවෙකුගේ කටේ තිබ්බයින් පස්සේ අම්ම කොච්චර ලොකු ගුලි හැදුවත් පොඩි එකා කන්නේ එයාගේ කටට ගන්න පුළුවන් ටික විතරයි. ඒක නිසා ලොකු ගුලි හැදුවොත් මම, මටත් වෙන්නේ ඔය අම්මට වෙච්ච දෙයයි. ඒක නිසා මේ පින්වතුන්ගේ හිතේ ග්‍රහණයට තරම් වන්නාවූ කොටසක් විතරයි මම කාණ්ඩ කරන්නේ. ඊට පස්සේ ටිකක් ඉස්සරහට යන කොට කීප ගමනක්ම මේ පින්වතුන්ට අහන්න ලැබෙන කොට අර කියාගන්ට තියෙන ටික ඔක්කොම කාණ්ඩ කාණ්ඩ කරලා කියන කොට ඒක වැටහේවි. ඒක නිසා මම ටිකක් අරගන්නේ ඔය හේතුව නිසා. පාඩමක් හැටියට ගත්තොත් තේරේවා හෝ වේවා නොතේරේවා එහෙමනම් එක දවසින් topic එක ඉවරයි. ඉතින් අද ජයන්ත මහත්තය එකතු වෙලා ඒවගේ බොහොම ගාම්භීර ධර්‍ම කොටසක් තමයි මේ කතාකරේ. හරිම සියුම්. ආරම්මණ ප්‍රත්‍යය කියන එක හරිම සූක්ෂමයි. හරිම සූක්ෂමයි. වචනය නෙමෙයි, ඒකෙන් කියවෙන ධර්‍මයටයි යන්න ඕන වෙන්නේ.

ඉතින් මේවගේ මේ සාකච්ඡා කරන්ට ධර්ම මණ්ඩපයකට පින්වතුන් එක්කාසු කරගෙන මේ වැඩ සටහන පවත්වාගෙන යන සත්පුරුෂ මහත්මයා තමයි අපේ පිංවත් ලලිත් දළුවත්ත මහත්මයා. එතුමා මේ දවස්වල තරමක අසනීපයෙන් ඉන්නේ. ඉතින් මේ ධර්ම සාකච්ඡා කිරීම තුලින් අපි ධර්ම සන්තෝසයක් ලබනවා. ඒ වගේම හිත මෙහෙයවලා ධර්ම කරුණු හොයනවා. ඒවගේම ධර්මවිචය සම්බොජ්ඣංගය හදා ගන්නවා. ඒවගේම නිවනේ තිබෙන්නාවූ ස්වභාවයත් සුතමය ඥානය වශයෙන් ගන්නවා. ඉතින් මේ තුලින් උපදවාගන්න කුසල ශක්තිය හරිම ගාම්භීරයි. මහා බලවත්. ඒ බලවත් ගාම්භීර වූ ධර්මය දේශනා කොට වදාළ බුදුරජාණන්වහන්සේගේ බුදුගුණ බලයෙන් ධර්මරත්නයේ දහම් ගුණ බලයෙන් සංඝ රත්නයේ සඟ ගුණ බලයෙන් අපි මේ ධර්මය සාකච්ඡා කිරීම තුලින් උපදවාගත්ත කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් පිංවත් ලලිත් දළුවත්ත මහත්මයාට නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! එතුමාගේ අතීත අකුසල කර්ම බලවේග යටපත් වේවා! කුසල කර්ම බලවේග ශක්තිය මතුවේවා! අපල උපද්‍රව හිංසා පීඩා සියල්ලක්ම දුරුවේවා! ඒ වාගේම ග්‍රහ අපල සියල්ල දුරුවේවා! එතුමාට නිරෝගී භාවය ඉතා ඉක්මනින් සැලසේවා! ඒවාගේම බෙහෙත් හේත් ඖෂධ ප්‍රතිකාර ඒ බෙහෙත් ගැනීමට උපකාර, වෛද්‍ය වරුන්ගේ උදව් උපකාර සියල්ලක්ම කලට වෙලාවට නොඅඩුව සැලසිලා නොඅඩුව ලැබිල එතුමාට නිරෝගී භාවය ලබා ගන්ට හැකිවේවා කියල අපි මෛත්‍රියෙන් පින්දීල ප්‍රාර්ථනා කරමු. ඒවගේම පවුලේ සැම දෙනාටත් පිංවත් ජයන්ත මහත්මා ඇතුළු මේ ප්‍රශ්න ඇසූ ඒ පිංවත් මහත්ම මහත්මීන් සැමදෙනාටමත් මේ උතුම් ධර්මය නිවන් පිණිසම හේතු වේවා! ධර්ම සැනසිල්ල මතුකරගෙන ධර්මය මෙනෙහි කොටගෙන පාරමී පුරාගෙන ඒවගේම ඉන්ද්‍රිය ධර්ම බල ධර්ම බොජ්ඣංග ධර්ම වඩාගෙන හැම දෙනාටම නිවනින් සැනසෙන්ට ලැබේවා! මේ පින මේ කුසලය නිවන් පිණිස හේතු වාසනා වේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං<br>
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං<br>
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා<br>
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.